
# සටහන

2020 ජූලි - සැප්තැම්බර්
39 වෙළුම 07 - 09 කලාපය



2 දකුණු කොරියාවේ සමාජ, ආර්ථික තොරතුරු බිඳක්
3 ජාතික ගෙවුම් සහ ගෙවුම් තුලනය අතර සබඳතාව
9 සමීපස්ථයන් අතර ණය යනු කුමක්ද?
14 රාජ්‍ය මූල්‍ය අංශයේ සංඛ්‍යාන පිළියෙළ කිරීමේ නව ක්‍රමවේදය
17 ආර්ථික සංවර්ධනය උදෙසා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර

රු. 20/-

ISSN 1391-3697
02079
9 770041 001632


ශ්‍රී ලංකා මහ බැංකුව
සන්නිවේදන දෙපාර්තමේන්තුව






# දකුණු කොරියාව

## සමාජ, ආර්ථික තොරතුරු බිඳක්...



නැගෙනහිර ආසියාවේ පිහිටා ඇති කොරියානු අර්ධද්වීපයේ දකුණු කොටස නිල වශයෙන් හැඳින්වෙන්නේ “කොරියානු ජනරජය” ලෙසයි. මෙහි උතුරු සීමාව වන්නේ උතුරු හා දකුණු කොරියානු රාජ්‍ය අතර පිහිටි යුද මුක්ත කලාපයයි. නැගෙනහිරින් ජපන් මුහුදත්, බටහිරින් කහ මුහුදත්, දකුණින් නැගෙනහිර චීන මුහුදත් දකුණු කොරියාවේ අනෙකුත් සීමාවන් වෙනවා. “සියොල්” එහි අග නගරයයි.

1910 වසරේ ජපන් අධිරාජ්‍යයට නතු වූ මෙම භූමිය 1945 දෙ වන ලෝක යුද්ධයෙන් ජපානය පරාජයට පත් වන තුරු ම ජපන් අධිරාජ්‍යයේ කොටසක් ලෙස පැවතුනා. ඉන්පසු මෙම භූමිය උතුරු හා දකුණු වශයෙන් දෙකට බෙදුණු අතර, උතුරු කොරියාව සෝවියට් සංගමය විසිනුත් දකුණු කොරියාව ඇමරිකා එක්සත් ජනපදය විසිනුත් පාලනය වුණා. නැවත එක්සත් වීම සඳහා කළ සාකච්ඡා අසාර්ථක වූයෙන් 1948 දී වෙන ම රාජ්‍යයන් දෙකක් බිහි වුණා. 1950 දී උතුරු කොරියාව චීනයේ සහ සෝවියට් සංගමයේ සහයෝගය ඇතිව දකුණට එරෙහි ව යුද වැදුණු අතර, එහි දී දකුණු කොරියාවට ඇමරිකා එක්සත් ජනපදයේ සහයෝගය ලැබුණා. වසර 3ක් පුරා පැවති කොරියානු යුද්ධයේ දී ඇමරිකානුවන් සහ කොරියානුවන් ඇතුළු ලක්ෂ ගණනකට ජීවිත අහිමි වුණා.

වර්තමානය වන විට තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ දියුණුවේ හිණිපෙත්තට ම නැග සිටින දකුණු කොරියාව ලොව වේගවත් ම අන්තර්ජාල පහසුකම් සිය රටවැසියන්ට ලබා දෙනවා.■

මූලාශ්‍ර - World Fact Book
Wikipedia විශ්වකෝෂය

| | |
|---|---|
| භූමි ප්‍රමාණය<br>මුළු ප්‍රමාණය වර්ග කි.මී.<br>ගොඩ බිම් ප්‍රමාණය වර්ග කි.මී.<br>අභ්‍යන්තර ජලාශ වර්ග කි.මී. | <br>99,720<br>96,920<br>2,800 |
| ජනගහනය (2020 ඇස්තමේන්තු) | 51,835,110 |
| ජනගහන වර්ධන වේගය | 0.39% |
| උපත් අනුපාතය (2020 ඇස්තමේන්තු)<br>(ජනගහනය දහසකට) | 8.2 |
| මරණ අනුපාතය (2020 ඇස්තමේන්තු)<br>(ජනගහනය දහසකට) | 6.8 |
| ළදරු මරණ අනුපාතය (2020 ඇස්තමේන්තු)<br>(සජීවී උපත් දහසකට) | 3 |
| උපතේ දී ජීවිත අපේක්ෂාව (අවුරුදු) (2020 ඇස්තමේන්තු) | 82.6 |
| දළ දේශීය නිෂ්පාදිතය (2017 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් ට්‍රිලියන 2.035 |
| මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය<br>(2017 ඇස්තමේන්තු) | 3.1% |
| ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය (2017 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් 39,500 |
| දළ දේශීය නිෂ්පාදිතයේ ආංශික සංයුතිය (2017 ඇස්තමේන්තු)<br>කෘෂිකර්මය<br>කර්මාන්ත<br>සේවා | <br>2.2%<br>39.3%<br>58.3% |
| ශ්‍රම බලකාය (2017 ඇස්තමේන්තු) | මිලියන 27.75 |
| සේවා වියුක්තිය (2017 ඇස්තමේන්තු) | 3.7% |
| කුටුම්භ ආදායමේ ගිනි සංගුණකය (2018 ඇස්තමේන්තු) | 30.7. |
| අයවැය අතිරික්තය (+) හෝ හිඟය (-) (2007 ඇස්තමේන්තු)<br>දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස | 1.4% |
| උද්ධමන අනුපාතය (2017 ඇස්තමේන්තු) | 1.9% |
| ආනයන (2017 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 2.32 |
| ආනයන භාණ්ඩ | පෙට්‍රෝලියම් නිෂ්පාදන, අර්ධ සන්නායක, ස්වාභාවික ගෑස්, ගල් අඟුරු, වානේ, රෙදිපිළි, පරිගණක |
| අපනයන (2017 ඇස්තමේන්තු) | එක්සත් ජනපද ඩොලර් බිලියන 577.4 |
| අපනයන භාණ්ඩ | රථවාහන, වාහන අමතර කොටස්, සන්නිවේදන උපකරණ, නැව්, පරිගණක |
| මුදල් ඒකකය | දකුණු කොරියානු වොන් |


“සටහන” සඟරාවෙහි පළවන අදහස් ඒ ඒ ලේඛකයන් ගේ අදහස් මිස ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස් නොවිය හැකි ය.

ශ්‍රී ලංකා මහ බැංකුව නමට ලියන ලද මුදල් ඇණවුම්/චෙක්පත් මෙහි සඳහන් ලිපිනයට එවීමෙන් “සටහන” තැපෑලෙන් ගෙන්වා ගත හැකි ය.

පිටපතක මිල : රු. 20.00
වාර්ෂික දායකත්වය : රු. 320.00
(තැපැල් ගාස්තු ද ඇතුළත්ව)

අධ්‍යක්ෂ
සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ. පෙ. 590, කොළඹ


# ජාතික ගෙවුම් සහ ගෙවුම් තුලනය අතර සම්බන්ධතාව

**ඩී. පී. ඩී. අයි. ඒකනායක**
**නියෝජ්‍ය අධ්‍යක්ෂ,**
**සංඛ්‍යාන දෙපාර්තමේන්තුව**


ආර්ථිකයක් පිළිබඳ ව විශ්ලේෂණය කිරීමේ දී වැදගත් වන සාර්ව ආර්ථික විචල්‍යයන් හා දර්ශක ගණනාවක් ජාතික ගිණුම්කරණය තුළින් ජනනය වේ. දළ දේශීය නිෂ්පාදිතය සහ ඒ තුළින් ජනනය වන ආර්ථික වර්ධන වේගය, ආයෝජන, පරිභෝජනය ආදිය ඒ අතර ප්‍රධාන වේ. මෙම ජාතික ගිණුම්, රටක ජාත්‍යන්තර වශයෙන් කෙරෙන ගනුදෙනු සටහන් කෙරෙන ගෙවුම් තුලනය හා සහසම්බන්ධ ව පවතී. ජාතික නිෂ්පාදිතය, වැය කළ හැකි ජාතික ආදායම, ජාතික ඉතුරුම් වැනි සාර්ව ආර්ථිකමය වශයෙන් වැදගත් දර්ශක මෙන් ම ද්විත්ව හිඟය (රාජ්‍ය මූල්‍ය හිඟය හා ජංගම ගිණුමේ හිඟය) වැනි සංකල්ප විශ්ලේෂණය කිරීමේ දී ද රාජ්‍ය මූල්‍ය සහ මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ දී ද ජාතික ගිණුම් හා ගෙවුම් තුලනය අතර සම්බන්ධතාව පිළිබඳ අවබෝධය ඉතා වැදගත් වේ.

ගෙවුම් තුලනයෙහි ජංගම ගිණුම ආර්ථිකයක ක්‍රියාකාරිත්වය පිළිබිඹු කරන වැදගත් සංරචකයකි. ජංගම ගිණුමෙහි උප අංශ වන වෙළෙඳ හා සේවා ගිණුම, ප්‍රාථමික ආදායම් ගිණුම හා ද්විතීයික ආදායම්

**ජාතික ගිණුම්හි;**




**ගෙවුම් තුලනයෙහි;**



ගිණුම ජාතික ගිණුම්කරණයේ දී සෘජු ව ම සම්බන්ධ වේ. ජාතික ගිණුම්කරණයේ දී, ආර්ථිකයේ සමස්ත (රාජ්‍ය මෙන් ම පෞද්ගලික) පරිභෝජන සහ ආයෝජන වියදම්වලින් සමන්විත වන දළ දේශීය වියදමට ජංගම ගිණුමෙහි ඇතුළත් වෙළෙඳ හා සේවා ගිණුමෙහි ශේෂය හෙවත් ශුද්ධ අපනයන එකතු කිරීමෙන් දළ දේශීය නිෂ්පාදිතය ජනනය වේ. ආර්ථික විද්‍යාවේ දී මෙ බඳු සබඳතාවන් සර්ව සාම්‍යයන් ලෙස හඳුන්වයි. එය සමීකරණයක් ආශ්‍රිත ව 3 වන පිටුවේ දැක්වෙන රූපසටහනින් දැක්විය හැකි ය.

මෙහි දී දළ දේශීය නිෂ්පාදිතයට වඩා දළ දේශීය වියදම ඉහළ/පහළ නම් එයින් පිළිබිඹු වනුයේ ජංගම ගිණුමේ වෙළෙඳ හා සේවා ගිණුමෙහි හිඟයක්/අතිරික්තයක් පවතින බවයි. ඒ අනුව දළ දේශීය නිෂ්පාදිතය දළ දේශීය වියදමට සමාන වන විට වෙළෙඳ හා සේවා ගිණුමෙහි ශේෂය ශූන්‍ය වේ. මෙම සබඳතාව පහත පරිදි දැක්විය හැකි ය.

දළ දේශීය නිෂ්පාදිතය Y − දළ දේශීය වියදම E = වෙළෙඳ හා සේවා ගිණුමෙහි ශේෂය (ශුද්ධ අපනයන) X-M

දළ දේශීය නිෂ්පාදිතයට වඩා දළ දේශීය වියදම ඉහළ නම් වෙළෙඳ හා සේවා ගිණුමෙහි හිඟයක් පවතී.

දළ දේශීය නිෂ්පාදිතය Y < දළ දේශීය වියදම E → වෙළෙඳ හා සේවා ගිණුමෙහි හිඟයක් පවතී

දළ දේශීය නිෂ්පාදිතයට වඩා දළ දේශීය වියදම අඩු වූ විට වෙළෙඳ හා සේවා ගිණුමෙහි අතිරික්තයක් පවතී.

දළ දේශීය නිෂ්පාදිතය Y > දළ දේශීය වියදම E → වෙළෙඳ හා සේවා ගිණුමෙහි අතිරික්තයක් පවතී

දළ දේශීය නිෂ්පාදිතය දළ දේශීය වියදමට සමාන වන විට වෙළෙඳ හා සේවා ගිණුමෙහි ශේෂය ශූන්‍ය වේ.

දළ දේශීය නිෂ්පාදිතය Y = දළ දේශීය වියදම E → වෙළෙඳ හා සේවා ගිණුම ශූන්‍ය වේ


ඒ අනුව ජාතික ගිණුම් සමඟ ගෙවුම් තුලනයෙහි ජංගම ගිණුමෙහි එක් උප අංගයක් වන ශුද්ධ අපනයන සම්බන්ධ වන අයුරු සහ යම් ආර්ථිකයක ස්වභාවය විග්‍රහ කිරීමේ දී මෙම සම්බන්ධය තුළින් ගම්‍ය වන තොරතුරුවල වැදගත්කම දැන් ඔබට වැටහෙනු ඇත.

දෙවනුව, අප ජංගම ගිණුමෙහි තවත් උප අංශයක් වන ප්‍රාථමික ආදායම් ගිණුම වෙත යොමු වෙමු. ප්‍රාථමික ආදායම් ගිණුමෙහි ශේෂය (ශුද්ධ අගය) යනු විදේශගත ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් ජනනය වන ආදායම් ලැබීම්

වලින් ශ්‍රී ලංකාවේ සේවයේ නියුතු විදේශිකයන්ට කරනු ලබන ගෙවීම් අඩු කළ විට ලැබෙන අගය වේ. ශ්‍රම ආදායම් (සේවක වැටුප්), මූල්‍ය වත්කම් හෝ ස්වාභාවික සම්පත් කුලියට දීමෙන් ජනනය වන ආදායම් ප්‍රාථමික ආදායම් ලෙස සැලකේ. මෙහි දී සේවක වැටුප් ලැබීම්/ගෙවීම් ලෙස සැලකෙන්නේ විදේශයන්හි/ශ්‍රී ලංකාවෙහි වසරකට වඩා අඩු කාලයක් සේවයේ නියුතු ශ්‍රී ලාංකීය/විදේශීය (අනේවාසික) ශ්‍රමිකයන්ට ජනනය වන ආදායම් වේ. ඒ අනුව ජංගම ගිණුමෙහි, ප්‍රාථමික ගිණුමෙහි ශේෂය, ශුද්ධ සේවක වැටුප් (සේවක වැටුප් ලැබීම් හා ගෙවීම් අතර වෙනස) හා ආයෝජන ආදායම්වලින් සමන්විත වේ.

මෙම ශුද්ධ ප්‍රාථමික ආදායම් දළ දේශීය නිෂ්පාදිතයට එකතු කළ විට දළ ජාතික ආදායම සැකසේ. මෙම සබඳතාව පහත පරිදි දැක්විය හැකි ය.

**ජාතික ගිණුම්හි,**





ගෙවුම් තුලනයෙහි ජංගම ගිණුමෙහි අවසන් උප අංශය වන ද්විතීයික ආදායම් නැතහොත් ශුද්ධ විදේශීය ජංගම සංක්‍රාම, රජයට ලැබෙන ආදායම් (විවිධ යෝජනා ක්‍රම, ආහාර හා වෙළෙඳ ද්‍රව්‍ය, මූල්‍ය හා තාක්ෂණික ආධාර වශයෙන් ලැබෙන ප්‍රදාන) සහ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලින් සමන්විත වේ. ජාතික ගිණුම්කරණයේ දී දළ ජාතික ආදායමට ශුද්ධ විදේශීය ජංගම සංක්‍රාම නැතහොත් ද්විතීයික ආදායම එක් කළ විට වැය කළ හැකි දළ ජාතික ආදායම සැකසේ.

එය පහත පරිදි දැක්විය හැකිය.

**ජාතික ගිණුම්හි,**

**ගෙවුම් තුලනයෙහි,**



වැය කළ හැකි ජාතික ආදායම හා ජංගම ගිණුම අතර ඇති සබඳතාව තුළින් ඉතුරුම් ආයෝජන පරතරය පහත පරිදි ව්‍යුත්පන්න කළ හැකි ය.

වැය කළ හැකි ජාතික ආදායම GNDI = දළ දේශීය නිෂ්පාදිතය GDP + ශුද්ධ ප්‍රාථමික ආදායම BPI + ශුද්ධ ද්විතීයික ආදායම BSI

ඉහත සබඳතාවෙහි දළ දේශීය නිෂ්පාදිතය පහත පරිදි තවදුරටත් දිග හැර දැක්විය හැකි ය.

ද.දේ.නි. (පරිභෝජනය C + ආයෝජන I + ශුද්ධ අපනයන X-M)

වැය කළ හැකි ජාතික ආදායම GNDI = පරිභෝජනය C + ආයෝජන I + ශුද්ධ අපනයන X-M + ශුද්ධ ප්‍රාථමික ආදායම BPI + ශුද්ධ ද්විතීයික ආදායම BSI

ජංගම ගිණුමේ ශේෂය CAB (ශුද්ධ අපනයන X-M + ශුද්ධ ප්‍රාථමික ආදායම BPI + ශුද්ධ ද්විතීයික ආදායම BSI)

ඉහත සමීකරණයෙහි ශුද්ධ අපනයන, ප්‍රාථමික හා ද්විතීයික ආදායම්හි එකතුවෙන් ජංගම ගිණුමෙහි ශේෂය සැකසෙන බව අපි දනිමු. මෙම සමීකරණයෙහි වැය කළ හැකි දළ ජාතික ආදායමෙන් පරිභෝජනය ඉවත් කළ විට දළ ජාතික ඉතුරුම් ජනනය වේ. ඒ අනුව දළ ජාතික ඉතුරුම්, ආයෝජන හා ජංගම ගිණුමෙහි ශේෂයෙන් සමන්විත වේ. ඉහත සමීකරණය නැවත සැකසීමෙන් එය පහත පරිදි දැක්විය හැකි ය.

වැය කළ හැකි ජාතික ආදායම GNDI − පරිභෝජනය C = ආයෝජන I + ජංගම ගිණුමේ ශේෂය CAB


ජාතික ඉතුරුම් = ආයෝජන I + ජංගම ගිණුමේ ශේෂය CAB

මෙම සබඳතාවෙන් ජාතික ඉතුරුම් හා ආයෝජන අතර පරතරය ලබා ගත හැකි අතර එය ජංගම ගිණුමේ ශේෂයට සමාන වේ. එය පහත පරිදි දැක්විය හැකිය.





ඒ අනුව ආයෝජන හා ඉතුරුම්හි සිදු වන වෙනස්වීම් ජංගම ගිණුමෙහි ක්‍රියාකාරිත්වය කෙරෙහි බලපායි. ඉතුරුම්වලට වඩා ආයෝජන වැඩි/අඩු වුවහොත් ජංගම ගිණුමෙහි හිඟයක්/අතිරික්තයක් ඇති වේ. මෙයින් ගම්‍ය වනුයේ, ජංගම ගිණුමෙහි යහපත් වර්ධනයක් ඇති කිරීම පිණිස ආදායමට සාපේක්ෂ ව වියදම් අඩු කිරීම හෝ ජාතික ආදායම වර්ධනය කිරීමට පියවර ගත යුතු බවයි. මෙම සබඳතාව ප්‍රතිපත්ති තීරණ ගැනීමේ දී ඉතා වැදගත් වේ. ඒ අනුව ප්‍රතිපත්තිමය  තීරණ වශයෙන් විදේශ වෙළෙඳාම් මත වන බදු සංශෝධනය කිරීම, විනිමය අනුපාතිකය වෙනස් කිරීම වැනි ක්‍රියාමාර්ග තුළින් ආනයන හා අපනයන කෙරෙහි බලපෑම් ඇති කරන විට ආයෝජන සහ ඉතුරුම්වල හැසිරීම කෙරෙහි ද ඉන් බලපෑම් ඇති වේ.

ආයෝජන මෙන් ම ඉතුරුම්, රාජ්‍ය මෙන් ම පෞද්ගලික ආයෝජන හා ඉතුරුම්වලින් සමන්විත වේ.




ඒ අනුව ඉතුරුම් හා ආයෝජන ජංගම ගිණුම සමඟ ඇති සබඳතාව වඩාත් ගැඹුරින් විග්‍රහ කර බැලීම සඳහා ඉහත සමීකරණය තවදුරටත් දිගහැර රාජ්‍ය හා පෞද්ගලික ඉතුරුම් හා ආයෝජන පරතරයන් වෙන්කොට පහත පරිදි දැක්විය හැකි ය.




මෙ මගින් ආර්ථිකමය වශයෙන් ඉතා වැදගත් කරුණක් ගම්‍ය වේ. එනම් රජයේ ඉතුරුම්වලට වඩා ආයෝජන වැඩි නම් සහ එය පුද්ගලික අංශයේ ඉතුරුම්වලින් පියවීමට නො හැකි නම් ජංගම ගිණුමෙහි හිඟයක් ඇති වේ. එ නම් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති මගින් ජනනය වන රාජ්‍ය අයවැය පරතරය ජංගම ගිණුමෙහි ක්‍රියාකාරිත්වයට බලපාන ඉතා වැදගත් සාධකයක් වේ. රජයක් අඛණ්ඩ ව සිය ආදායම් අභිබවා වියදම් සිදු කරන්නේ නම් එයින් අඛණ්ඩ රාජ්‍ය මූල්‍ය හිඟයක් ජනනය වේ. මෙ ලෙස අඛණ්ඩ රාජ්‍ය මූල්‍ය හිඟයක් පැවතීම, අඛණ්ඩ ජංගම ගිණුමෙහි හිඟයක් ද ජනනය වීමට හේතු වේ. මෙය ද්විත්ව හිඟය ලෙස හැඳින්වේ.

ඒ අනුව ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ දී එ මගින් ඉතුරුම් හා ආයෝජනවලට ඇති වන බලපෑම මෙන් ම ජංගම ගිණුමට ඇති විය හැකි බලපෑමත් විග්‍රහ කිරීමට අවශ්‍ය මූලික පසුබිම මෙම අවසන් සමීකරණය මගින් සැකසේ. කෙසේ වුව ද, යම් ප්‍රතිපත්තිමය තීරණයක බලපෑම විග්‍රහ කිරීමේ දී මෙම සමීකරණයෙහි විචල්‍යයන්ට ඉන් ඇති විය හැකි බලපෑම ගැඹුරින් සලකා බැලිය යුතු ය. මෙම විචල්‍යයන් අතර අන්තර් සබඳතාවක් පවතී. උදාහරණයක් ලෙස, රජය මගින් සිය අයවැය පරතරය අඩු කිරීම සඳහා බදු වැඩි කිරීම සළකා බලමු. මෙය රජයේ නිර්ඉතුරුම් අඩු වීමට මෙන් ම ජංගම ගිණුමෙහි වර්ධනයට ද හේතු විය හැකි බව සිතිය හැකි ය. නමුත් එ මගින් පෞද්ගලික අංශයේ ආයෝජන හා ඉතුරුම් තීරණ කෙරෙහි ඇති විය හැකි බලපෑම ද සැලකිය යුතු ය. මෙහි දී පෞද්ගලික ආයෝජනවලට ධනාත්මක හෝ සෘණාත්මක බලපෑමක් මෙ මගින් ඇති විය හැකි ය. උදාහරණයක් ලෙස, බදු වැඩි වීම බලපානුයේ පරිභෝජනය මත නම්, පරිභෝජනය අඩු වීමෙන් ආයෝජන සඳහා අවශ්‍ය දේශීය සම්පත් (ඉතුරුම්) වැඩි වනු ඇත. නමුත් ඉහළ බදු හේතුවෙන් අත්‍යවශ්‍ය පරිභෝජන වියදම් ඉහළ යෑමෙන් වැය කළ හැකි ආදායම අඩු වීමටත්, එ මගින් පුද්ගලික ඉතුරුම් පහළ යෑමටත් ඉඩ ඇත. එම නිසා යම් ප්‍රතිපත්තියක බලපෑම නිවැරදි ව විග්‍රහ කිරීමට එ මගින් සියලු ම විචල්‍යයන්ට ඇති විය හැකි බලපෑම පිළිබඳ විස්තරාත්මක තොරතුරු භාවිතයෙන් ගැඹුරු විශ්ලේෂණයක් කළ යුතු ය. එ මගින් සමස්ත බලපෑමෙහි අවසන් ප්‍රතිඵලය නිවැරදි ව හඳුනා ගත හැකි ය.■

# සමීපස්ථයන් අතර ණය යනු කුමක් ද?

**ඒ.ජී.ආර්. අබේකෝන්**
**ජ්‍යේෂ්ඨ සහකාර ලේකම්**
**ලේකම් දෙපාර්තමේන්තුව**

සමීපස්ථයන් අතර ණය (Peer-to-Peer Lending) යනුවෙන් හඳුන්වනුයේ සමීපතමයන් අතර අතරමැදියෙකු ලෙස සහභාගීත්ව නිල මූල්‍ය ආයතනයක් නොමැති ව පුද්ගලයන්ට හෝ ව්‍යාපාරවලට සෘජු ව ම ණය ලබා දීමකි. සමීපස්ථයන් අතර ණය දීම සාමාන්‍යයෙන් සිදු වන්නේ ණය හිමියන් සහ ණය ගැතියන් ඒ සඳහා වූ මාර්ගගත වේදිකා (Online Platforms) ඔස්සේ සම්බන්ධ වීමෙනි. සමීපස්ථයන් අතර ණය දීම මගින් ආරක්ෂිත මෙන් ම අනාරක්ෂිත ණය ද ලබා දෙයි. කෙ සේ වෙතත්, සමීපස්ථයන් අතර ලබා දෙනු ලබන මෙ වැනි ණයවලින් බොහොමයක් අනාරක්ෂිත පෞද්ගලික ණය ගණයට අයත් වේ.

සමීපස්ථයන් අතර ණය ක්‍රමයේ ඉතිහාසය සොයා බලන විට එය මෙසපොතේමියානු ශිෂ්ටාචාරය (ක්‍රි.පූ. 5000 - 3500) දක්වා දිව යන බව පැහැදිලි වනු ඇත . එම ශිෂ්ටාචාරයන්හි වාසය කළ ගොවියන් තම අස්වැන්න නෙලා අවසන් වූ පසු, ගෙවීමේ පොරොන්දුව පිට ණය ලබා ගැනීම සිදු කර ඇත. එය අද දක්වා ම විවිධ මුහුණුවරින් ක්‍රියාත්මක වෙමින් පවතී. මේ ආකාර වූ සමීපස්ථයන් අතර ණය ක්‍රමය වර්තමානයේ දියුණු තාක්ෂණික ක්‍රමයන් වන අන්තර්ජාල බැංකුකරණය, ජංගම දුරකථන බැංකුකරණය වැනි දෑ මගින් ඉතාමත් යුහුසුළු ව හා පහසුවෙන් සිදු කිරීමට හැකියාව පවතින නිසා සීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙමින් පවතී.


එසේ ම වාණිජ බැංකු, ඉතිරිකිරීමේ බැංකු සහ වෙනත් සාම්ප්‍රදායික තැන්පතු භාර ගන්නා ආයතන, ආයෝජන හා රක්ෂණ ආයතනවලින් සිදු කරනු ලබන මූල්‍ය අතරමැදිකරණ කාර්යයට වෙනස් වූ මූල්‍ය අතරමැදිකරණ කාර්යයක් මෙම සමීපස්ථයන් අතර ණය ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබන මූල්‍ය අතරමැදිකරණ ආයතන මගින් සිදු කෙරෙයි.

සමීපස්ථයන් අතර ණය ක්‍රමය සඳහා එ ලෙස මූල්‍ය අතරමැදිකරණයෙන් දායකත්වය සපයන ආයතන විකල්ප මූල්‍ය සේවා සැපයීමේ ආයතන ලෙස හැඳින්වේ.

කෙ සේ වුව ද වර්තමානයේ දී, සමීපස්ථයන් අතර ණය ක්‍රමය යටතේ සාම්ප්‍රදායික නො වන මූල්‍ය අතරමැදිකරණ ආයතන සහ අන්තර්ජාලය ප්‍රධාන පහසුකම් සලසන්නා ලෙස භාවිත කරමින් නො හඳුනන පුද්ගලයන් අතර ණය හෝ ආයෝජන ගනුදෙනු සිදු කෙරෙයි. මෙහි දී ණය ලබා ගන්නා පුද්ගලයා විසින් කිසිඳු ඇප ආවරණයක් ණය ලබා දෙන්නාට නො දෙන අතර, වර්තමානයේ දී මෙම ක්‍රමය මගින් ශිෂ්‍ය ණය, වාණිජ ණය, ඉඩම් ණය, පෞද්ගලික ණය හා අනාරත්ෂිත ව්‍යාපාරික ණය ආදිය ලබා ගත හැකි ය.

සමීපස්ථයන් අතර ණය පහසුකම් ලබා ගත හැකි ආකාරය නැතිනම් මෙම ක්‍රමය තාක්ෂණික වශයෙන් සිදු කරනු ලබන ආකාරය පහත රූප සටහන ආශ්‍රයෙන් මනාව පැහැදිලි කළ හැකි ය. මෙහි දී සියලු ම හුවමාරුවීම් සිදු වන්නේ මංගත (Online) ක්‍රමයට වීම මෙහි ඇති සුවිශේෂී ලක්ෂණයක් වේ.

ඉහත රූප සටහන අනුව සමීපස්ථයන් අතර ණය ක්‍රමය ක්‍රියාත්මක වන ආකාරය අවස්ථා හතරක් (4) යටතේ පැහැදිලි කළ හැකි ය. එ නම්,




1. මූලික අයදුම්පත්‍රය සහ අරමුදල් හුවමාරුව (Initial Application and Funding)
2. ණය ලියකියවිලි හුවමාරුව (Loan Note Transfer)
3. ණය ලියකියවිලි මිලදී ගැනීම (Loan Note Purchasing)
4. ණය ආපසු ගෙවීම (Loan Repayment) ලෙස වේ.

මූලික අවස්ථාවේ දී ම ණය ලබාගන්නා පුද්ගලයා (ණය ගැතියා) විසින් ණය පහසුකම් සලසන ජාලය (Lending Platform) හරහා අයදුම්පත්‍රයක් ඉදිරිපත් කළ යුතු වේ. ඒ අවස්ථාව වන විට ණය ලබා දීමට කැමති/ආයෝජනය කිරීමට කැමති පුද්ගලයින් (ණය හිමියන්) රාශියක් තම අරමුදල්වලට අවශ්‍ය ලංසුව ද සඳහන් කරමින් පහසුකම් සලසන්නා වෙත ඉදිරිපත් වී ණය ගැතියෙකු බලාපොරොත්තුවෙන් රැඳී සිටී. එසේ පිවිස සිටින ආයෝජකයන් අතරින් සුදුසු ආයෝජකයකු වෙත පහසුකම් සලසන්නා විසින්

ණය අයදුම් කරන පුද්ගලයාගේ ණය අයදුම්පත යොමු කරනු ලැබේ. මෙ ලෙස ආයෝජකයාට ණය අයදුම්කරුගේ ණය අයදුම්පත්‍රය යොමු කරනු ලබන්නේ ණය අයදුම් කරන පුද්ගලයා විසින් තහවුරු කරනු ලැබූ තුන්වන පාර්ශ්වයක් වන මූල්‍ය අතරමැදි ආයතනයේ ද තහවුරුව ලබා ගැනීමෙන් අනතුරු ව ආයෝජකයාගේ ද කැමැත්ත මත පදනම් ව ය. සියලු පාර්ශ්වයන්ගේ එකඟතාව සහ පහසුකම් සැලසීම මත අදාළ ගනුදෙනුව සිදු වනු ඇත.

දෙවනු ව මීට සමගාමී ව ණය ඉල්ලුම්කරු විසින් තුන්වන පාර්ශ්වය හරහා පහසුකම් සලසන්නා මගින් ණය ලියකියවිලි ආයෝජකයා වෙත යැවෙන අතර ඒ සමග ම ආයෝජකයා විසින් පහසුකම් සලසන්නා වෙත මුදල් ලබාදෙයි. ඒ වෙනුවෙන් ඔහුට ණය මිලදී ගැනීමේ රිසිට්පතක් නිකුත් කෙරෙයි. නමුත් විශේෂත්වය වනුයේ කිසිදු ඇප ආවරණයක් හෝ රජයේ ආරක්ෂණයක් මේ සඳහා ලබා නො දීමයි. සම්පූර්ණයෙන් ම අන්‍යෝන්‍ය අනන්‍යතාව මත පමණක් ම පදනම් ව මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වේ.

අවසාන වශයෙන් අරමුදල් ලබා ගත් පුද්ගලයා විසින් පහසුකම් සලසන්නා මාර්ගයෙන් ආයෝජකයාගේ ලංසු මුදලට යටත් ව මූල්‍ය අතරමැදිකරුවා හරහා ආයෝජකයාට ණය මුදල නැවත ගෙවීම සිදු කරයි.

## මහා බ්‍රිතාන්‍යයේ සමීපස්ථයන් අතර ණය ක්‍රමයේ වර්ධනය

මහා බ්‍රිතාන්‍යයේ පිහිටි සෝපා (Zopa) ආයතනය විසින් 2005 පෙබරවාරි මාසයේ දී සමීපස්ථයන් අතර ණය ක්‍රමය ලොව ප්‍රථම වරට මාර්ගගත ක්‍රමයට ආරම්භ කරනු ලැබී ය. වර්තමානය වන විට දහස් ගණනක් සෝපා වැනි පහසුකම් සලසන ආයතන මහා බ්‍රිතාන්‍යය තුළ බිහි වී ඇත. සෝපා ආයතනය විසින් 2017 වර්ෂයේ දී පමණක් සමීපස්ථයන් අතර ණය ක්‍රමය මගින් පවුම් මිලියන 240ක් වටිනා ගනුදෙනු සිදු කර ඇති අතර ඔවුන් ආරම්භයේ සිට 2018 වසර දක්වා මෙමෙ ණය ක්‍රමය යටතේ පවුම් මිලියන 853ක් වටිනා ගනුදෙනු සිදු කර ඇත. වර්තමානයේ දී සෝපා ආයතනය මහ බ්‍රිතාන්‍යයේ සමීපස්ථයන් අතර ණය ලබා දෙනු ලබන විශාල ම ආයතනය බවට පත් ව ඇත්තේ ආයෝජකයින් 52,000කින් හා ණය ඉල්ලුම්කරුවන් 80,000කින් සමන්විත ජාලයකට හිමිකම් පාමිනි.

එ සේ වුව ද 2010 වර්ෂය වන විට පහසුකම් සලසන්නෙක් ලෙස කටයුතු කළ සෝපා ආයතනයට අභියෝගයක් එල්ල කරමින් එ වැනි තවත් සමාගම් රාශියක් සමීපස්ථයන් අතර ණය ව්‍යාපෘතියට පහසුකම් සලසන්නන් ලෙස කටයුතු කිරීම සඳහා ඉදිරිපත් විය. ඒ අනුව බිහි වූ ප්‍රධාන ම ආයතන දෙකක් ලෙස "Market Invoice" සහ "Assets Capital"දැක්විය හැකි ය. එම ආයතන විසින් කුඩා හා මධ්‍ය පරිමාණ ණය ඉල්ලුම සඳහා විසඳුම් ලබා දීමට කටයුතු කර ඇත. මේ අතර 2012 මැයි මාසයේ දී බ්‍රිතාන්‍ය රජය මෙම සමීපස්ථයන් අතර ණය ක්‍රමයට අදාළ විකල්ප ණය දීමේ මාර්ග හරහා ණය ලබා දීම වෙනුවෙන් ඩොලර් මිලියන 100ක් ආයෝජනය කිරීමට තීරණය කිරීම මෙ වැනි විකල්ප ණය ක්‍රම ප්‍රචලිත කිරීමට ගත් උත්සාහයක් ලෙස සැලකිය හැකි ය.

කෙ සේ වුවද, අඩු ණය ශ්‍රේණිගත කිරීමක් සහිත ණය ගැනුම්කරුවන්ට හෙවත් ණය ආපසු අය කර ගැනීමේ අවදානම වැඩි පුද්ගලයන්ට ණය සැපයීම නිසා ඇති වූ ණය ගැටලුව හෙවත් උපප්‍රමුඛ ණය (Subprime Loans) ගැටලුව ඇති වූ අවස්ථාවේ දී බ්‍රිතාන්‍ය රජය විසින් මෙ වැනි ණය දෙන ආයතන අවම කිරීමේ පරමාර්ථයෙන් අවම ප්‍රාග්ධන මට්ටම ඉහළ දැමීම වැනි ක්‍රියාමාර්ග අනුගමනය කරමින් වංචාකාරී ණය දෙන ආයතන පාලනය කරන ලදී. ඒ අනුව, 2014 අප්‍රේල් මාසයේ දී මෙම ණය දීමේ කර්මාන්තයට නීත්‍යානුකූලභාවය ඇති කිරීම සඳහා බලයලත් ආයතන ලෙසට බ්‍රිතාන්‍ය රජය විසින් මූල්‍ය ආයතන පාලනය කරනු ලබන අධිකාරිය පත්කරන ලදී.

## ඇමරිකා එක්සත් ජනපදය තුළ සමීපස්ථයන් අතර ණය ක්‍රමයේ වර්ධනය

ඇමෙරිකා එක්සත් ජනපදයේ සැන්ෆ්‍රැන්සිස්කෝ නගරය මූලික කර ගෙන 2006 පෙබරවාරි මාසයේ දී මෙම සමීපස්ථයන් අතර ණය දීමේ ක්‍රමය ආරම්භ විය. මෙහි ආරම්භක අවධියේ දී ණය ලබා ගන්නාට මූලික ණය මුදල ලබා ගැනීමට සුදුසුකම් ලැබීම සඳහා යම් යම් ප්‍රතිරෝධකවලට මුහුණ දීමට සිදු විය. එ සේ බාධාවන්ට මුහුණ දීමට සිදු වූයේ ණය පැහැර හැරීමේ ප්‍රවණතාව හා ප්‍රතිශතය ඉතා ඉහළ අගයක් ගැනීම හේතුවෙනි.

1933 සුරැකුම්පත් ආඥා පනතට අනුව සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් 2008 දී මෙම සමීපස්ථයන් අතර ණය දීමේ ක්‍රමය සඳහා ලියාපදිංචිය ආරම්භ කරන ලදී. කෙසේ වුව ද මෙ ලෙස මෙම යෝජනා ක්‍රමයේ යෙදී සිටින පුද්ගලයින් ලියාපදිංචිය එතරම් පහසු වූයේ නැත. මන්ද, එතරම් ම විශාල පිරිසක් ඒ වන විටත් මෙම යෝජනා ක්‍රමය වැළඳ ගෙන සිටි හෙයිනි. ඒ නිසා ඇමරිකානු සුරැකුම්පත්

හා විනිමය කොමිෂන් සභාව විසින් ලියාපදිංචිය අවසාන වන තෙක් මෙම යෝජනා ක්‍රමය හරහා සිදු වන ගනුදෙනු නතර කරන ලදී.  එහි දී ජාත්‍යන්තර ව සුප්‍රසිද්ධ සෝපා ආයතනය පවා තම ගනුදෙනු සිදු කිරීම නතර කරන ලදී. ඒ අනුව ආයෝජකයා සහ ණය ලබා ගන්නා පුද්ගලයා යන දෙදෙනා ම සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට නම් දෙපාර්ශ්වය ම එකඟතාවකට පැමිණීමෙන් පසු අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමක් අවශ්‍ය විය.

අවසානයේ දී ඇමෙරිකා එක්සත් ජනපදයේ සමීපතමයන් අතර ණය යෝජනා ක්‍රමය කළඹ ණය දෙන හා ආයෝජන ඇණවුම් භාරගන්නා "ෆෝලියෝන්" (Portfolio Lending Investment Order-FOLIO) ආයතනයන් සමඟ අත්වැල් බැඳ ගෙන ණය පත් සඳහා දෙවන වෙළෙඳපොළක් (Secondary Market) හඳුන්වා දෙන ලදී. එක්සත් ජනපද සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ (US Securities and Exchange Commission) නීත්‍යනුකූලභාවයට අමතර ව පසු කාලයේ දී මෙම යෝජනා ක්‍රමයේ නීත්‍යනුකූලභාවය යාවත්කාලීන කිරීම සඳහා පාරිභෝගික මූල්‍ය ආරක්ෂණ අධිකාරියට (Consumer Financial Protection Bureau) සහ ෆෙඩරල් තැන්පතු රක්ෂණ සමාගමට (Federal Deposit Insurance Corporation) රජය විසින් බලය පවරන ලදී. කෙසේ වුව ද, වර්තමානයේ දී සමීපතමයන් අතර ණය ගනුදෙනු යෝජනා ක්‍රමය සඳහා ඇමරිකානු එක්සත් ජනපදය නීත්‍යනුකූල පසුබිමක් සකසා ඇති බව පෙන්වා දිය හැකි ය.

## ශ්‍රී ලංකාව තුළ සමීපස්ථයන් අතර ණය ක්‍රමයේ ව්‍යාප්තිය

ශ්‍රී ලංකාවේ සමීපතමයන් අතර ණය ගනුදෙනුව පිළිබඳ ව අධ්‍යයනය කිරීමේ දී එය සිංහල රජ දවස දක්වා ම දිවයනු ඇත. රජ දවස ශ්‍රී ලංකාවේ වාසය කළ බොහෝමයක් ජනයා අතර අස්වනු නෙලා ගෙවීමේ පොරොන්දුව පිට ණය ලබා ගැනීම ඉතාමත් ප්‍රචලිත ක්‍රමයක් විය. එය වර්තමානයේ සමීපතමයන් අතර ණය ගනුදෙනුවට ඉතාමත් සමීප අත්දැකීමක් වන අතර වර්තමානයේ දී එම ක්‍රමය අඩු වැඩි වශයෙන් ශ්‍රී ලංකාව තුළ තව දුරටත් ක්‍රියාත්මක වේ. කෙසේ වුව ද, සාම්ප්‍රදායික ව එ සේ ඇත අතීතයේ සිට මෙම ක්‍රමය ලංකාවේ මුල් බැසගෙන තිබුණ ද වර්තමාන ජාලගත ක්‍රමයට සමීපතමයන් අතර ණය හුවමාරු ක්‍රමය ආරම්භ කරනු ලැබුයේ Helios P2P ආයතනය විසින් 2018 අගෝස්තු මාසයේ දී ය.

## සමීපස්ථයන් අතර ණය දීමේ දී ඇති අභියෝග හා එහි ඉදිරි ගමන් මග

2000 - 2005 අතර කාලයේ දී සමීපස්ථයන් අතර ණය ලබා දීමේ ක්‍රමවේදය සීඝ්‍රයෙන් දියුණු වීමට හේතු වූයේ එහි ඇති සාර්ථකත්වය හා ඒ කෙරෙහි ඇති විශ්වාසය පලුදු නො වන අයුරින් විවිධ රටවල එය ප්‍රචලිත ව තිබීම නිසා ය. කෙසේ වුව ද, ඉහළ ව්‍යාප්තිය නිසා ම පසු කාලයේ දී ණය ලබා ගන්නා පුද්ගලයන් ණය පැහැර හැරීමේ ප්‍රවණතාව ක්‍රමයෙන් ඉහළ අගයක් ගනු ලැබී ය. ඒ නිසා ආයෝජකයන් අනවශ්‍ය අවදානමක් ගැනීමට සූදානම් වූයේ ද නැත. ඒ නිසා ම, සමීපතමයන් අතර ණය හුවමාරුව සිදු කරන අතරමැදි ආයතන විසින් ඉහළ පොලී අනුපාතයක් නියම කරමින් ණය ලබාගන්නා පුද්ගලයන් ණය ගැනීම සඳහා අධෛර්යමත් කිරීමට කටයුතු කරන ලදී. ඒ තුළින් මෙම ක්‍රමය යටතේ ණය ගැනීම් කරනු ලබන පුද්ගලයන් සංඛ්‍යාව අඩුවීමේ ප්‍රවණතාවක් ඇති විය.

වර්තමානය වන විට ඇමෙරිකා එක්සත් ජනපදයේ සාම්ප්‍රදායික ණය ලබා දෙන ආයතනවලට සම්බන්ධ ව සිටින විධායකයින් විසින් ඔවුන්ගේ ණය දෙන්නන්, ආයෝජකයන් හා ප්‍රධාන සාංගමික මණ්ඩලවල සිටින සාමාජිකයන්ගෙන් සැදුම්ලත් නව මූල්‍ය අතරමැදිකරණයේ යෙදෙන ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩලවල සාමාජිකයන්, ඇමෙරිකා එක්සත් ජනපදයේ මුදල් අමාත්‍යාංශයේ හිටපු ලේකම්වරයා, බැංකුකරුවන්, අලෙවිකරුවන්, ආයෝජකයින් සහ ආයතනික ධනපතියන් (Venture Capitalists) යන පාර්ශ්ව මෙම ක්‍රමයට අන්තර්ග්‍රහණය කිරීමට සමීපස්ථයන් අතර ණය දෙන ආයතනවල දෙවන වාර්ෂික ණය සමුළුවේ (Second Annual Lending Conference) දී එකඟත්වය පළ කර ඇත.

2014 මැයි මාසයේ දී ඇමෙරිකා එක්සත් ජනදයේ පැවැති ගෝලීය නියාමකයින්ගේ සංගමයේ රැස්වීමේ දී සමීපතමයන් අතර ණය ක්‍රමය වර්ධනයට බලපාන සාධක පිළිබඳ ව සාකච්ඡා කර ඇති අතර එය ඇමෙරිකා ආර්ථිකයේ නව පිම්මකට රුකුලක් වේ ද යන්නත් සලකා බලා ඇත.  එ සේ ම මෙම ක්‍රමය බැංකුකරණයේ නව උපකරණයක් බවට පත්කර එය අධීක්ෂණය කිරීමට කටයුතු කළ යුතු බවට ද සාකච්ඡා වී ඇත්තේ දැනට නිශ්චිත නීත්‍යනුකූලභාවයක් මේ සඳහා ලබා දී නොමැති අභියෝගයට පිළිතුරක් සෙවීම සඳහා ය.

කෙසේ වුව ද, විශාල ප්‍රමාණයේ අරමුදල් ඇති ආයෝජකයින් සහ විකල්ප ආයෝජන අරමුණු කර ගෙන එකතු කරන ලද බොහෝ තනි ආයෝජකයින්ගේ

කළඹ අරමුදල් හෙවත් හෙජ් අරමුදල් (Hedge Funds) නිසා මෙම සමීපතමයන් අතර ණය ලබා දීමේ ක්‍රමය වර්තමානයේ ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වී ඇත. ඒ නිසා එහි පොලී අනුපාතිකය හෙවත් ලංසුව දැනට 24% ක් තරම් ඉහළ අගයක් කරා ගමන් කර ඇත. ඒ අනුව විශාල ප්‍රමාණයේ ආයෝජකයන් වෙනුවට සාමාන්‍ය ජනතාව මේ වන විට මෙම ක්‍රමයට ඇතුළත් වීමට දක්වන කැමැත්ත තවදුරටත් වැඩි වී ඇති බව ඇමෙරිකා එක්සත් ජනපදය පවසයි. ඒ නිසා මෙම අරමුදල්වලට ආරක්ෂාව සැපයීම තවදුරටත් අභියෝගයක් වී පවතිනු ඇත.

එ සේ ම මෙම ක්‍රමය පිළිබඳ ව උනන්දුවක් දක්වන පුද්ගලයන් විසින් වර්තමානයේ දී සමීපස්ථයන් අතර ණය ක්‍රමයේ ප්‍රධාන ගැටලුවක් හඳුනාගෙන ඇත. එ නම්, වෘත්තීය ආයෝජකයින් විසින් අනෙකුත් හුදකලා ආයෝජකයන් ආක්‍රමණය කරමින් පැවතීම යි. එ සේ ම මෙම ආයෝජකයින් මූල්‍ය වෙළෙඳපොළ අතර ඉක්මණින් හා නිතිපතා ගමන් කරන මුදල් හෙවත් චකිත මුදල් (Hot Money) හඹා යෑම ද තවත් වර්ධනාත්මක අභියෝගයක් ලෙස ද සැලකිය හැකි ය. එ මගින් ආයෝජකයන්ට ලබා ගත හැකි ඉහළ ම කෙටි කාලීන පොලී අනුපාත සඳහා බාධක යොදා ඇති බවට සහතිකයක් ලැබේ. එ හෙයින් අඛණ්ඩ ව අඩු පොලී අනුපාත ඇති රටවලින් ඉහළ අනුපාත ඇති රටවලට චකිත මුදල් හුවමාරු කරනු ලබන නිසා සමීපතමයන් අතර ණය ගනුදෙනු සඳහා බලපෑමක් සිදු වනු ඇත. එ සේ ම සමීපස්ථයන් අතර ණය දීමේ ක්‍රියාවලිය අද වන විට ඇත්ත වශයෙන් ම සමීපස්ථයන් අතර ණය ක්‍රමයක් ද යන්න හිතෙන තරම් ආයතනික ආයෝජකයින්ට ගොදුරු වී ඇත.

**නිර්දේශය**

සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් ශ්‍රී ලංකාව තවදුරටත් ආනයන මත යැපෙන රටකි. නමුත් තමා සතු ව අරමුදල් පවතින පිරිස් ලංකාව තුළ නැතුවා නො වේ. ඔවුන් අතරින් ඇතැමෙක් ඍජු ආයෝජනයට මැලිකමක් දක්වනුයේ ඒ පිළිබඳ ව දැනුම නොමැතිකම නිසා හෝ තාක්ෂණික හැකියාව නොමැති නිසා ය. අනෙක් අතට දක්ෂ ව්‍යවසායකයින් බොහෝමයක් තම හැකියාව ලංකාවේ සංවර්ධනයට දායක නො කරනුයේ තමා සතු ව ආයෝජනයට අරමුදල් නොමැති නිසා ය. අරමුදල් සපයා ගැනීමට සාම්ප්‍රදායික මූල්‍ය අතරමැදියන් වෙත ඉදිරිපත් කිරීමට ඔවුන් සතු ව සුදුසු ඇප ආවරණයන් ද නොමැත. එ සේ නම් අරමුදල් සතු පාර්ශ්ව සහ අරමුදල් නොමැති, ඇප ආවරණ නොමැති නමුත් ආයෝජනය පිළිබඳ ව නිපුණත්වයක් ඇති පාර්ශ්ව අතර පාලමක් සැකසීමට මෙම සමීපස්ථයන් අතර ණය ක්‍රමය කදිම තෝතැන්නකි. මෙම ක්‍රමය ක්‍රියාත්මක කරවීමට හැකි නම් එය ලංකාව තුළ ආයෝජන වර්ධනය කිරීමට පිටිවහලක් වනු ඇත. එ සේ වුවත්, මෙම ක්‍රමය ශ්‍රී ලාංකීය ජනතාවගේ මූල්‍ය සාක්ෂරතාව හා තාක්ෂණික දැනුම ඉහළ නංවා නෛතික පසුබිමක් සකස් කිරීමෙන් අනතුරු ව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගැනීම වඩාත් යෝග්‍ය වේ. ඒ තුළින් රට තුළ ආයෝජන වර්ධනය කරමින් ආනයන මත රැඳෙන ආර්ථිකයක් වෙනුවට දේශීය ව නිපදවන භාණ්ඩ හා සේවා පරිභෝජනය තුළින් රටේ ආර්ථික වර්ධනය ඇති කිරීමට හැකියාව ඇති බව පෙන්වා දිය හැකි ය.■

# රාජ්‍ය මූල්‍ය අංශයේ සංඛ්‍යාන පිළියෙල කිරීමේ නව ක්‍රමවේදය

**කේ ඒ යූ එස් කේ තිලකරත්න**
**ජ්‍යේෂ්ඨ අර්ථශාස්ත්‍රඥ සහ රාජ්‍ය මූල්‍ය අංශ ප්‍රධානී**
**ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව**

**ජී ටී ආර් ප්‍රියදර්ශන**
**ජ්‍යේෂ්ඨ අර්ථශාස්ත්‍රඥ**
**ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව**

රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන (Government Finance Statistics-GFS) යනු, රාජ්‍ය මූල්‍ය අංශයේ සංඛ්‍යාන සම්පාදනය කිරීම සඳහා අදාළ මාර්ගෝපදේශ ඉදිරිපත් කිරීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් සකස් කරනු ලැබූ ගිණුම්කරණ රාමුව වේ.[1] රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන මගින් රජයේ ආදායම, රජයේ වියදම, අයවැය හිඟය/අතිරික්තය, හිඟය මූල්‍යනය, රාජ්‍ය ණය, රජයේ වත්කම්, ශුද්ධ/දළ මෙහෙයුම් ශේෂය, ශුද්ධ ණය ලබාදීම්, ශුද්ධ ණය ගැනීම් යනාදී තොරතුරු ඉදිරිපත් කෙරේ. තව ද, රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන සාර්ථක මූල්‍ය විශ්ලේෂණයක් සඳහා පදනමක් සපයන අතර, ඵලදායී රාජ්‍ය මූල්‍ය වැඩ සටහන් නිර්මාණය සහ අධීක්ෂණයටත්, ආර්ථික ප්‍රතිපත්ති වඩා සුපරීක්ෂාකාරී අන්දමින් සිදු කිරීමටත් අවශ්‍ය වැදගත් භූමිකාවක් ද ඉටු කරයි.

## රාජ්‍ය මූල්‍ය අංශයේ සංඛ්‍යාන පිළියෙළ කිරීමේ ක්‍රමවේදයෙහි විකාශය

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් නිකුත් කරනු ලැබූ 1986 රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන අත්පොත (GFSM 1986)[2] රාජ්‍ය මූල්‍ය අංශයේ සංඛ්‍යාන, වාර්තාකරණය සහ විනිවිදභාවය වැඩිදියුණු කිරීම සඳහා අනුගමනය කරනු ලැබූ ප්‍රථම ජාත්‍යන්තර මට්ටමේ උත්සාහය වේ. මෙම අත්පොත මගින් රාජ්‍ය මූල්‍ය අංශයේ ගිණුම් සම්පාදනය කිරීම සඳහා මග පෙන්වනු ලබයි. ඒ අනුව. රාජ්‍ය මූල්‍ය ගනුදෙනු සාරාංශගත කිරීම සහ සංවිධානය කිරීම තුළින් විශ්ලේෂණය, සැලසුම්කරණය සහ නිර්ණය කිරීම සඳහා යෝග්‍ය තොරතුරු සම්පාදනය කෙරෙයි.

1986 රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන අත්පොතෙහි ඇතුළත් ක්‍රමවේදයන්හි සැලකිය යුතු නවීකරණයක් හා පුළුල් කිරීමක් සිදු කරමින් රාජ්‍ය මූල්‍ය පිළියෙළ කිරීම සම්බන්ධ නව අත්පොතක්, එනම් 2001 රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන අත්පොත (GFSM 2001)[3] ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් 2001 වසරේ දී හඳුන්වා දෙන ලදී. මෙම අත්පොතෙහි විශේෂත්වය වන්නේ මූල්‍යමය නො වන ගනුදෙනු,[4] ගනුදෙනු නො වන වෙනත් ආර්ථික ප්‍රවාහ[5] සහ ශේෂ පත්‍ර යනාදිය මෙහි විශ්ලේෂණ රාමු තුළ ඇතුළත් වීමයි. මුදල් පදනම (Cash Basis) මත ගිණුම් තැබීම වෙනුවට උපචිත පදනම (Accrual Basis) මත ගිණුම් තැබීම මෙහි දී භාවිත වේ.

2001 අත්පොතෙහි වැඩිදියුණු කිරීමක් 2014 රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන අත්පොත (GFSM 2014)[6] මගින් ඉදිරිපත් කරන ලදී. 2014 රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන අත්පොත;

(i) සංඛ්‍යාන සම්පාදනය කිරීමට යොදා ගත හැකි ආර්ථික හා සංඛ්‍යානමය වාර්තා කරන මූලධර්ම ඉදිරිපත් කරයි.

(ii) යෝග්‍ය ශේෂ පත්‍ර අයිතම ඇතුළු විශ්ලේෂණාත්මක රාමුවක් තුළ රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන වාර්තා කිරීමේ මාර්ගෝපදේශ ඉදිරිපත් කරයි.

(iii) ජාතික ගිණුම්, ගෙවුම් ශේෂය, මුදල් හා මූල්‍ය සංඛ්‍යාන, රාජ්‍ය ණය හා විදේශ ණය යනාදී අනෙකුත් සාර්ව ආර්ථික සංඛ්‍යාන සැකසීමේ නවතම මාර්ගෝපදේශවලට අනුකූල වේ.

---


1. https://stats.oecd.org/glossary/detail.asp?ID=1136
2. A Manual on Government Finance Statistics 1986 (GFSM 1986)
3. Government Finance Statistics Manual 2001 (GFSM 2001)
4. උදා: මුදල් වෙනුවට භාණ්ඩ හෝ සේවා මගින් ගෙවීම් කිරීම
5. උදා: මිල වෙනස්වීම්, ණය කපා හැරීම්, ආපදා තත්ත්වයන් හේතු කොට ගෙන ඇති වන අලාභ
6. Government Finance Statistics Manual 2014 (GFSM 2014)

## රාජ්‍ය මූල්‍ය අංශයේ සංඛ්‍යාන පිළියෙළ කිරීම සම්බන්ධ ව ශ්‍රී ලංකාවේ භාවිතය

වර්තමානයේ දී, මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් 1986 රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන අත්පොත පදනම් කර ගෙන රාජ්‍ය මූල්‍ය අංශයේ සංඛ්‍යාන පිළියෙළ කරනු ලබන අතර, එම තොරතුරු මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව හා ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව ඇතුළු විවිධ ප්‍රකාශන මගින් ඉදිරිපත් කෙරෙයි. මීට අමතර ව, 1986 අත්පොත පදනම් කර ගෙන සම්පාදනය කරනු ලැබූ සංඛ්‍යාන, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2014 අත්පොතෙහි ආකෘතියට පරිවර්තනය කරනු ලබන අතර, එය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන වාර්ෂික වාර්තාවෙහි (GFSY)[7] ප්‍රකාශයට පත් කෙරෙයි.

7. Government Finance Statistics Yearbook (GFSY)

### රාජ්‍ය අංශය සහ එහි උප අංශ




මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන අත්පොත 2014, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල

1. සමාජ ආරක්ෂණ අරමුදල් ඇතුළත් වේ.
2. විකල්පයක් ලෙස, කඩ ඉරිවලින් යුත් රාමුව මගින් පෙන්වන පරිදි සමාජ ආරක්ෂණ අරමුදල් වෙන ම උප අංශයක් ලෙස ඒකාබද්ධ කළ හැකි ය.
3. අයවැයගත ඒකක, අයවැයගත නො වන ඒකක, හා සමාජ ආරක්ෂණ අරමුදල් ද ප්‍රාන්ත රාජ්‍යවල සහ පළාත් පාලන ආයතන තුළ ද ඇතුළත් විය හැකි ය.

කෙසේ නමුත්, රාජ්‍ය මූල්‍ය අංශයේ තොරතුරු සම්පාදනය වැඩිදියුණු කිරීම අරමුණු කර ගනිමින් මුදල් අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා මහ බැංකුව මෑතක සිට රාජ්‍ය මූල්‍ය අංශයේ සංඛ්‍යාන පිළියෙළ කිරීම සඳහා 1986 රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන අත්පොත භාවිත කිරීම වෙනුවට 2014 රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන අත්පොත භාවිතා කිරීමේ මාර්ගයට අවතීර්ණ වෙමින් සිටී. මෙම කාර්යය සඳහා අන්තර්ජාතික මූල්‍ය අරමුදල විසින් තාක්ෂණික සහාය ලබා දෙමින් පවතී. මේ සඳහා මුදල් අමාත්‍යාංශයේ අදාළ දෙපාර්තමේන්තු, ශ්‍රී ලංකා මහ බැංකුව සහ ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අදාළ නිලධාරීන්ගෙන් සමන්විත සම්බන්ධීකරණ කමිටුවක් ස්ථාපිත කර ඇත. මෙම කමිටුව මගින් රාජ්‍ය මූල්‍ය අංශයේ සංඛ්‍යාන ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් රජයේ ආයතනික රාමුව (15 වන පිටුවේ රූප සටහන) පුළුල් කිරීම සඳහා නොයෙකුත් පියවර අනුගමනය කරමින් පවතී. වර්තමානයේ දී මූලික වශයෙන් අයවැයගත මධ්‍යම රජය (Budgetary Central Government - BCU) සම්බන්ධයෙන් සංඛ්‍යාන ඉදිරිපත් කිරීම සිදු වේ. ඉදිරියේ දී අයවැයගත මධ්‍යම රජයට පරිබාහිර රාජ්‍ය ආයතන (Extra Budgetary Units - EBUs) ඇතුළත් කරමින් මධ්‍යම රජය (Central Government - CG) සඳහා ගිණුම් සකස් කිරීමට කටයුතු කෙරෙමින් පවතී.

මේ සඳහා රජයට අයත් ආයතන; (1) අයවැයගත මධ්‍යම රජයට පරිබාහිර ආයතන (EBUs) සහ (2) රාජ්‍ය ආයතන (Public Corporations) යනුවෙන් වර්ගීකරණය කිරීම ආරම්භ කර ඇත. තව ද, මධ්‍යම රජයේ සංඛ්‍යාන පළාත් සභා සහ පළාත් පාලන ආයතනයන්හි රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාන සමඟ ඒකාබද්ධ කර සමස්ත රජය (General Government-GG) සඳහා ද රාජ්‍ය මූල්‍ය ගිණුම් සම්පාදනය කිරීමට නියමිත ය.

මීට අමතර ව, වර්තමානයේ දී රාජ්‍ය මූල්‍ය ගිණුම් සැකසීම සඳහා වැඩිදියුණු කළ මුදල් පදනම (Modified Cash Basis) භාවිතා කෙරෙන අතර උපචිත පදනම වෙත පරිවර්තනය වීම සඳහා කටයුතු සිදු කෙරෙමින් පවතී. 2018 රජයේ වාර්ෂික අයවැය අනුව ඉදිරි වසර 10ක කාල පරිච්ඡේදයක දී උපචිත ගිණුම්කරණ ක්‍රමවේදයට පරිවර්තනය වනු ඇත. මෙ මගින් වගවීම හා විනිවිදභාවය තහවුරු කෙරෙමින් රාජ්‍ය මූල්‍ය අංශයේ ශේෂ පත්‍රය වැඩිදියුණු කෙරෙනු ඇත.■

මූලාශ්‍ර :


1. අයවැය කථාව 2018
2. A Manual on Government Finance Statistics 1986
3. Government Finance Statistics Manual 2001
4. Government Finance Statistics Manual 2014
5. වාර්ෂික වාර්තාව 2016 - මුදල් අමාත්‍යාංශය





# ආර්ථික සංවර්ධනය උදෙසා
# කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර

**එන්. එම්. එම්. දමයන්ති**
**නියෝජ්‍ය අධ්‍යක්ෂ**
**ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව**

1. **සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයක් යනු කුමක්ද?**

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයක් යනු ආර්ථිකයේ ආදායම් උත්පාදන ක්‍රියාවලියට සම්බන්ධ වී සිටින සේවක සංඛ්‍යාව හා ආදායම් ජනනය වන ප්‍රමාණය අතින් කුඩා මට්ටමක් පෙන්නුම් කරන ව්‍යාපාර ආයතන විශේෂයකි. මේවා කෘෂිකාර්මික, කාර්මික හා සේවා අංශ ඔස්සේ ක්‍රියාත්මක වේ. ලෝකයේ සෑම රටක ම විශාල වශයෙන් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ව්‍යාප්ත වී ඇති අතර ඒවා නිර්වචනය කර හඳුනා ගෙන ඇති ආකාරය රටින් රටට වෙනස් වෙයි. උදහරණ වශයෙන්,

(i) **ඉන්දියාව:** සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අර්ථකථනය කර ඇත්තේ කර්මාන්තශාලවල යන්ත්‍ර හෝ උපකරණවල ආයෝජනය කර ඇති මුදල් ප්‍රමාණය පදනම් කර ගෙනයි. ඒ අනුව,

1 වන වගුව: ව්‍යාපාර වර්ගීකරණය - ඉන්දියාව

| ව්‍යාපාර වර්ගය | නිෂ්පාදන අංශය<br>කර්මාන්ත හා යන්ත්‍ර සූත්‍රවල ආයෝජනය (ඉන්දියානු රු.) | ප්‍රමාණය<br>(උපකරණ සඳහා ආයෝජනය කර ඇති ප්‍රමාණය) |
|---|---|---|
| ක්ෂුද්‍ර | මිලියන 2.5 | මිලියන 1 |
| සුළු | මිලියන 2.5 - මිලියන 50 | මිලියන 1 - මිලියන 20 |
| මධ්‍යම | මිලියන 50 - මිලියන 100 | මිලියන 20 - මිලියන 50 |

මූලාශ්‍රය : www.arthapedia.in

(ii) **මැලේසියාව:** වාර්ෂික පිරිවැටුම හෝ සේවක සංඛ්‍යාව පදනම් කරගෙන නිර්වචනය කර ඇත.

2 වන වගුව: ව්‍යාපාර වර්ගීකරණය - මැලේසියාව

| ව්‍යාපාර වර්ගය | වාර්ෂික පිරිවැටුම<br>(මැලේසියානු රින්ගිට්) | සේවක සංඛ්‍යාව |
|---|---|---|
| ක්ෂුද්‍ර | මිලියන 0.3 | 5 |
| සුළු | මිලියන 0.3 - මිලියන 15 | 5 - 75 |
| මධ්‍යම | මිලියන 15 - මිලියන 50 | 75 - 200 |

(iii) **සිංගප්පූරුව :** විවිධ වර්ගීකරණයන් නොමැති වුවත් සමස්තයක් වශයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ලෙස අර්ථකථනය කර ඇත්තේ වාර්ෂික පිරිවැටුම සිංගප්පූරු ඩොලර් 100 ට අඩු ව්‍යාපාරයි.

(iv) **යුරෝපා සංගමය :** ව්‍යාපාරයක වැඩ කරන සේවක සංඛ්‍යාව පදනම් කර ගෙන වර්ගීකරණය කර ඇත.

3 වන වගුව: ව්‍යාපාර වර්ගීකරණය - යුරෝපා සංගමය

| සේවක සංඛ්‍යාව | ව්‍යාපාර ඒකකය |
|---|---|
| 1 | ස්වයං රැකියා |
| 2 - 9 | ක්ෂුද්‍ර පරිමාණ |
| 10 - 49 | කුඩා පරිමාණ |
| 50 - 249 | මධ්‍ය පරිමාණ |

(iv) **ශ්‍රී ලංකාව :** ශ්‍රී ලංකාවේ ඉතිහාසය දෙස බලන කල විටින් විට විවිධ නිර්ණායකයන් භාවිත කර තිබූ බව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නිර්වචනය කර සොයා ගත හැකි වේ. පහත වගුවෙන් ඒ පිළිබඳ ව අපට යම් අවබෝධයක් ලබා ගත හැකි ය.

4 වන වගුව: ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නිර්වචනය

| ආයතනය | නිර්ණායකය | කුඩා පරිමාණ | මධ්‍ය පරිමාණ |
|---|---|---|---|
| ආර්ථික සංවර්ධන මණ්ඩල | යන්ත්‍රවල වටිනාකම | රු. මිලියන 4ට අඩු | රු. මිලියන 4 සිට රු. මිලියන 10 දක්වා |
| කර්මාන්ත සංචාරක හා ආයෝජන ප්‍රවර්ධන | ඉඩම්, ගොඩනැගිලි හැර ස්ථාවර වත්කම් වටිනාකම | රු. මිලියන 16 අඩු | රු. මිලියන 16 සිට රු. මිලියන 20 දක්වා |
| ආර්ථික හා වාණිජ මණ්ඩල | ප්‍රාග්ධන ආයෝජන | රු. මිලියන 2 අඩු | රු. මිලියන 2 සිට රු. මිලියන 20 දක්වා |
| ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩල | i. ඉඩම්, ගොඩනැගිලි හැර ප්‍රාග්ධන ආයෝජනයන්<br>ii. වාර්ෂික අපනයන පිරිවැටුම | රු. මිලියන 20 අඩු<br>රු. මිලියන 100 අඩු | රු. මිලියන 20 ට වැඩි<br>රු. මිලියන 100 ට වැඩි |
| ලෝක බැංකුව (ශ්‍රී ලංකාව පිළිබඳ අධ්‍යයනයේ දී) | සේවක සංඛ්‍යාව | 1-49 | 50-99 |
| ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව | සේවක සංඛ්‍යාව | 25ට අඩු (2000)<br>10ට අඩු (2003/2004) | 25ට වැඩි (2000)<br>10ට වැඩි (2003/2004) |

මූලාශ්‍රය : කතුවරයා විසින්

ඉහත නිර්වචනයන්ට අමතර ව විවිධ බැංකු තම ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නොයෙකුත් ආකාරයෙන් නිර්වචනය කර ඇත. උදාහරණ ලෙස:

5 වන වගුව: වාණිජ බැංකු සතු නිර්ණායකයන්

| වර්ෂය | ණය වැඩසටහන | ඉඩම් හා ගොඩනැගිලි හැර ස්ථාවර වත්කම් සඳහා ආයෝජනය (රු. මිලියන) | වාර්ෂික පිරිවැටුම (රු. මිලියන) | සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 2003 | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධන ව්‍යාපෘතිය (SMEDP) | 35 | - | - |
| 2008 | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘතිය (SMERDP) | 100 | 300 | 150 |
| 2011 | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති සංවර්ධන පහසුකම් ව්‍යාපෘතිය (SMEDeF) | - | 300 | - |
| 2010 | උතුරු හා නැගෙනහිර පළාත් සඳහා වූ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ණය ව්‍යාපෘතිය (MS-ME-kfw) | 50 | - | - |
| 2016 | ආසියානු සංවර්ධන බැංකුව මගින් ක්‍රියාත්මක කරන ලද සුළු හා මධ්‍ය පරිමාණ ණය ව්‍යාපෘතිය | - | 750 | කාර්මික අංශය - 300<br>සේවා අංශය - 200 |

මූලාශ්‍රය : කතුවරයා විසින්

මෙ වැනි විවිධාකාර අර්ථකථන පවතින ශ්‍රී ලංකාව වැනි රටකට දිගුකාලීන නිර්වචනයක් පැවතීමේ වැදගත්කම විටින් විට විවිධ පාර්ශ්වයන් විසින් මතු කරන්නට විය. ඒ අනුව කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය මගින් 2015 වසරේ "කුඩා හා මධ්‍ය පරිමාණ සංවර්ධන ජාතික ප්‍රතිපත්ති රාමුව" මැයෙන් ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හඳුනා ගැනීම සඳහා වාර්ෂික පිරිවැටුම හා සේවක සංඛ්‍යාව පදනම් කර ගෙන නිර්වචනයක් සකස් කර ඉදිරිපත් කර ඇත.

6 වන වගුව : කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශය මගින් ප්‍රසිද්ධ කරන ලද කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නිර්වචනයන්

| ව්‍යාපාර වර්ගය | වාර්ෂික පිරිවැටුම (රු. මිලියන) | | සේවක සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | කර්මාන්ත | සේවා | කර්මාන්ත | සේවා |
| ක්ෂුද්‍ර | 15 | 15 | 10 | 10 |
| කුඩා | 16 - 250 | 16 - 250 | 11 - 50 | 11 - 50 |
| මධ්‍ය | 251 - 750 | 251 - 750 | 51 - 300 | 51 - 200 |

මූලාශ්‍රය : කුඩා හා මධ්‍ය පරිමාණ සංවර්ධන ජාතික ප්‍රතිපත්ති රාමුව, 2015

අප රටට මෙම නිර්වචනයේ ගැළපීම කොතෙක් දුරට යථාර්ථවාදී ද යන්න පිළිබඳ ව තවදුරටත් සිතීමට අවකාශය ලබා දී ඇත. එ නම් වාර්ෂික පිරිවැටුම අනුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වෙන් කර දැක්වීම කොයිතරම් දුරට ප්‍රායෝගික නිර්වචනයක් ද යන්න සොයා බැලිය යුතු ය. එයට හේතුව වන්නේ ශ්‍රී ලංකාවේ බොහෝ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විගණනය නො කරන අතර නිවැරදි ආකාරයෙන් වර්ගීකරණය සිදු කිරීමට මෙ වැනි ව්‍යාපාර තුළ විගණන වාර්තා හෙවත් විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන නොමැති වීමයි. ඒ අනුව වැඩ කරන සේවක සංඛ්‍යාව පදනම් කර ගෙන මෙම ව්‍යාපාර හඳුනා ගැනීම යම් තරමකට කළ හැකි ය. නමුත් මෙහි දී ද මෙම ව්‍යාපාරවල සේවය කරන සියලු ම සේවකයින් සඳහා අදාළ ආයතනය විසින් සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල් ගෙවීම සිදු නො කරයි. එ බැවින් සේවක සංඛ්‍යාව නිවැරදි ව ගණනය කිරීම ප්‍රශ්න සහගත වේ. ඒ නිසා මේ සියල්ල යම් රාමුවකට නතුකර සුළු හා මධ්‍ය පරිමාණ ක්ෂේත්‍රයේ විධිමත්භාවය වර්ධනය කිරීම කාලෝචිත කරුණක් වේ.

## 2. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල අවශ්‍යතාව

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආර්ථික වර්ධනයේ යාන්ත්‍රණයක් ලෙස බොහෝ රටවල් හඳුනා ගෙන ඇති අතර විශේෂයෙන් ම දියුණු වෙමින් පවතින රටවල් වඩාත් සමෘද්ධිමත් අංශයක් කරා රැගෙන යන්නේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයයි. රැකියා උත්පාදනය, පුද්ගලයන් ව්‍යවසායකත්වයට පෙළඹවීම, ආදායම් උත්පාදනය හා සමාජ හා දේශපාලන ස්ථාවරත්වය සඳහා දිරිගැන්වීම් ලබා දීම වැනි ප්‍රතිලාභ ඔස්සේ සංවර්ධනය වෙමින් පවතින බොහෝ රටවල සාර්ව ආර්ථිකයට කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලින් ප්‍රතිලාභ හිමිකර දෙයි. නමුත්, ප්‍රධාන වශයෙන් ම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල අවශ්‍යතාව මතුවන්නේ;

i. දිළිඳුකම පිළිබඳ ගැටලුව හා

ii. රැකී රක්ෂා හිඟය පිළිබඳ පවතින ගැටලුව

යන ගැටලු ද්විත්වයන්ට පිළියමක් වශයෙන් ය.

ඒ අනුව පහත සඳහන් හේතු පදනම් කර ගෙන සංවර්ධන කාර්යයේ දී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලින් පුළුල් දායකත්වයක් ආර්ථික වර්ධනය කෙරෙහි ලබා දෙන බව අවබෝධ කර ගත හැකි වේ.

i. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා විශාල ශ්‍රම බලකායක (Labour-Intensive) දායකත්වයක් හිමි වන අතර විශාල පරිමාණයේ ආයතන හා සසඳන කල ආදායම බෙදී යෑම සමානාත්මක බවකින් යුක්ත ව සිදුවන්නේ මෙම අංශය තුළ ය.

ii. රැකියා උත්පාදනයේදී විශාල කාර්යභාරයක් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර තුළින් සිදු වන අතර දිළිඳු බව තුරන් කිරීම, දුගී පවුල්වලින් සේවයට බැඳෙන සේවකයින් සඳහා සාධාරණ වේතනයක් ලැබීම හා කාන්තාවන් සඳහා කිසියම් අමතර ආදායම් මාර්ගයක් ලෙස හෝ ස්ථිර ආදායම් මාර්ගයක් ලෙස ක්‍රියාත්මක වීමට අවස්ථාව උදා වීම.

iii. සංවර්ධනය වෙමින් පවතින රටවල සම්පත් වඩාත් කාර්යක්ෂම ආකාරයෙන් බෙදී යාමටත් ඒවායින් උපරිම ප්‍රයෝජන ගැනීමටත් ඉඩ ප්‍රස්ථාව ලැබීම.

iv. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආර්ථිකයේ පුළුල් පද්ධතිමය නිෂ්පාදන ධාරිතාවයක් ගොඩ නැංවීම කෙරෙහි යොමු කරවයි. මෙහිදී ඕනෑම ආකාරයකින් පවතින සම්පත් ඵලදායි ලෙස අවශෝෂණය කර ගැනීමට හැකියාව ලැබේ.

v. කුඩා හා මධ්‍ය පරිමාණ ආයතන අතර අන්තර් සම්බන්ධතාවය පවත්වා ගෙන යාමට අවස්ථාව උදාවන අතර ඒ තුළින් ආර්ථිකයට ඔරොත්තු දිය හැකි ව්‍යාපාර බවට පත්වීමට අවකාශය ලැබීම.

vi. සංවර්ධන කාර්යයට දායක වන අතර නාගරික හා ග්‍රාමීය ප්‍රදේශ තුල පවතින විෂමතාවය අවම කිරීමට කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ව්‍යාප්තිය ඉතා වැදගත් වෙයි.

## 3. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හා ව්‍යවසායකයා

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර රටක ඕනෑම ආර්ථිකයකට අත්‍යවශ්‍යම අංශයක් වන අතර ව්‍යවසායකයා එහි ප්‍රධාන භූමිකාව වෙයි. ව්‍යවසායකයා යනු යම් කිසි ලාභයක් අපේක්ෂාවෙන් මූල්‍යමය අවදානම් සියතට

ගෙන යම් ව්‍යාපාරයක් ගොඩනගනු ලබන පුද්ගලයාය. නැතහොත් සේවකයකු ලෙස යම් ස්ථානයක රාජකාරි කරනවාට වඩා විවිධ අවස්ථාවක් උපයෝගී කරගනිමින් ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් ව්‍යාපාරයක් සංවිධානය කරනු ලබන පුද්ගලයා ව්‍යවසායකයා ය.

ව්‍යවසායකයා යන්න හැඳින්වීමට විවිධ පුද්ගලයින් විවිධ අදහස් ඉදිරිපත් කර ඇත. ඒ අතරින් තෝරාගත් නිර්වචන කිහිපයක් පහත දැක්වේ.

i. ව්‍යාපාරයක හෝ ව්‍යාපාරික කටයුත්තක අවදානම සංවිධානය කරන, කළමනාකරණය කරන හා උපකල්පනය කරන තැනැත්තෙකු ව්‍යවසායකයා ය. (මේරියන් වෙබ්ස්ටර්)

ii. ව්‍යවසායකයා යනු පාලනය කළ හැකි සම්පත් ඉක්මවා යන අවස්ථාවයි. (හොවඩ් ස්ටෙවන්සන්)

iii. ව්‍යවසායකයා යනු ව්‍යාපාරයක හිමිකරුවකු පමණක් ම නො වේ. ලාභ ඉපයීමේ අපේක්ෂාවෙන් නව නිපැයුම් නිර්මාණය කිරීමේ වගකීම දරන්නා ව්‍යවසායකයා ය. (ජෝසප් හම්පීටර්)

iv. ව්‍යවසායකයා අවදානම් දරන්නෙකු වන අතර මූල්‍ය වෙළෙඳපොළේ අවදානම් වාරිකවලට වගකිව යුත්තකු ලෙස විශ්වාස කරයි. (ෆැන්ක් ක්නයිට්)

v. සොයා ගැනීම් පසුපස හඹා යන්නෙකු ව්‍යවසායකයෙකු වේ. (ඉස්රීල් කිස්නර්)

ඉහත නිර්වචනයන් දෙස බලන කළ පෙනී යන්නේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයක් කාර්යක්ෂම හා සාර්ථකත්වයෙන් යුතු ව නව නිපැයුම් සහිත ව වෙළෙඳපොළ ගවේෂණය කරමින් හඹා යන්නා සාර්ථක ව්‍යවසායකයෙකු වන අතර මෙවැනි ව්‍යාපාර ස්වාධීන ව ම කටයුතු කරයි.

### 3.1 සාර්ථක ව්‍යවසායකයෙකුගේ ගති ලක්ෂණ

#### i. ස්වයං අභිප්‍රේරණය

ව්‍යවසායකත්වයේ ඉතා වැදගත් ගුණාංගයක් ලෙස සලකනු ලබන්නේ ස්වයං අභිප්‍රේරණයයි. යම් පුද්ගලයකු සාර්ථක වීමට අවශ්‍ය නම් තමා විසින් ම ස්වයං අභිප්‍රේරණය වෙත යොමු විය යුතුයි. ව්‍යවසායකයෙකු කිසිදු පුද්ගලයකුට පිළිතුරු ලබා දිය යුතු නැත. ඒ නිසා සාර්ථකත්වයට ගමන් කිරීමේ දී ඉතා කැපවීමෙන් යුක්ත ව තම සැලසුම් මනා ලෙස භාවිත කරමින් ඉදිරියට ගමන් කළ යුතු ය. මෙහි දී කෙටි කාලීන ප්‍රතිලාභ අවම වන අතර දීර්ඝකාලීන ව ලාභ ලැබීමේ අපේක්ෂාව ඇති ව ව්‍යවසායකයා තම කාර්යභාරයන් ඉටු කරනු ලබයි.

#### ii. තමා ආර්ථිකයට මුදා හරින දේ පිළිබඳ මනා වැටහීමක් තිබීම

ව්‍යවසායකයාට තමා විසින් ම දියත් කරනු ලබන ව්‍යාපාරය පිළිබඳ ව මනා වැටහීමක් පවතින අතර එය අපේක්ෂිත වෙළෙඳපොළට සුදුසු වනවා ද යන්න පිළිබඳ අවබෝධයෙන් කටයුතු කරයි. ඒ අනුව, තමා සිටින ස්ථානය මනා ව තේරුම් ගෙන යා යුතු ස්ථානයට ගමන් කිරිමට හැකි වන පරිදි තමා විසින් ම අනුගත වීමට ඇති හැකියාව ඉතා වැදගත් ව්‍යවසායකත්ව ගති ලක්ෂණයක් වේ.

#### iii. අවදානම් භාරගැනීම

සාර්ථක ව්‍යවසායකයින් යම් යම් අවස්ථාවල අවදානම් භාර ගෙන කටයුතු කළ යුතු බව පොදු කරුණකි. නමුත්, ඒ සඳහා තර්කානුකූල ව කටයුතු කළ යුතු අතර අවදානම් නියමාකාරයෙන් ගණනය කල යුතුයි. එසේ ගණනය කරන ලද අවදානම නිසි පරිදී අවබෝධ කර ගැනීමත් ඒ සඳහා සාර්ථක ව මුහුණ දීමට අවශ්‍ය වටපිටාව ගොඩ නැගීමත් සාර්ථක ව්‍යවසායකයකු සතු වැදගත් ලක්ෂණයකි. එම නිසා සාර්ථක ව්‍යවසායකයෙකු වීමට අවශ්‍ය නම් අවදානම් කිහිපයක් හෝ භාර ගැනීමට කැමති විය යුතුයි.

#### iv. සම්බන්ධතා ගොඩනගා ගන්නා ආකාරය පිළිබඳ ඇති දැනුම

ජාලගත කරන්නේ (Network) කෙසේදැයි දැන ගැනීම ව්‍යවසායකත්වයේ වැදගත් අංගයකි. අන් අය සමග සම්බන්ධ වීමට සහ හවුල්කාරිත්වයන් ගොඩනගා ගැනීමට ව්‍යවසායකයකුට හැකියාව පවතී නම් එවැනි ව්‍යාපාරයක් හිමි තැනැත්තෙකුට බොහෝ දුරක් යා හැකි වේ. එසේ සම්බන්ධ වීමට ඇති අවස්ථාවන් තීරණය කර බලා අධ්‍යයනය කරන්නේ නම් ඵලදායී ව්‍යවසායකයෙකු වීමට ඉතා ඉහළින් හැකියාව ලැබෙනු ඇත.

**v. සාමාන්‍ය මුදල් කළමනාකරණය පිළිබඳ දැනුම හා අවබෝධයක් පැවතීම**

සාමාන්‍යයෙන් අප ව්‍යවසායකයකු දකින්නේ ඉතා පුළුල් චරිතයක් ලෙසයි. නමුත් ගිණුම්කරණයේ දී එදිනෙදා කටයුතු කළමනාකරණය කර ගැනීම පිළිබඳ හැකියාවක් ඔහු තුළ පැවතිය යුතු ය. නමුත් එහි දී ඉතා ඉහළ ගිණුම් කටයුතු පිළිබඳ දැනුමක් අපේක්ෂා නො කරන අතර සාර්ථකත්වය සඳහා මූලික මුදල් කළමනාකරණය පිළිබඳ දැනුමක් හා අවබෝධයක් පැවතීම අත්‍යවශ්‍ය වේ. ව්‍යාපාරික කටයුතුවල දී තම මුදල් සංසරණය වන ආකාරය තේරුම් ගත් විට තමා සිටින තැන අවබෝධ කර ගැනීමටත් තම ව්‍යාපාර කටයුතු හොඳ මූලධර්ම මත පිහිටා පවත්වා ගෙන යැමටත් හැකියාව ලැබෙනු ඇත.

**vi. නම්‍යශීලී බව**

සාර්ථක ව්‍යවසායකයකු වූ විට යම් යම් අවස්ථාවල දී නම්‍යශීලී ව කටයුතු කිරීම වැදගත් වේ. අවශ්‍ය වූ විට වෙනස් වීමට හා වෙනස් කිරීමට කැමැත්ත තිබිය යුතුයි. තමා තමාගේ ව්‍යාපාරයේ ඉහළින් ම සිටින මුත් අවශ්‍ය ඕනෑ ම අවස්ථාවක අදාළ ක්‍රියාවලියේ හා නිෂ්පාදනවල වෙනස්කම් සිදු කිරීමටත් ඒවා භාර ගැනීමටත් සූදානම් ව සිටිය යුතු ය. මේ සඳහා සිතෙහි හා සිතුවිලිවල පවතින නම්‍යශීලීත්වය බෙහෙවින් උපකාරී වේ. ගැටලු නිරාකරණයේ දී මෙය අත්‍යවශ්‍ය කරුණක් වේ.

**vii. උද්දීපනය**

ව්‍යවසායකයකු ධනාත්මක චින්තනයෙන් යුක්ත ව නිරන්තරයෙන් උද්දීපනය වන පුද්ගලයකු වන අතර ඔහු ඉතා උසස් පෞරුෂත්වයක් හිමි තැනැත්තෙකු වේ. මෙහි දී ව්‍යවසායකයාගේ ස්වයං හඳුනා ගැනීම වැදගත් වන අතර පුද්ගලික ව අර්ථාන්විත කාර්යයක් ඉටු කිරීමට නිරන්තරයෙන් උත්සාහ දරයි.

**viii. ඉගෙනීම, මිනිසුන් පිළිබඳ අවබෝධ කර ගැනීම හා අසාර්ථකත්වයන් පිළිබඳ විවෘත මනසකින් කටයුතු කිරීම.**

## 4. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ව්‍යාප්තිය

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විවිධ ආකාරයෙන් දැකිය හැකි අතර ඒවායේ ස්වභාවය අනුව විවිධ පැතිකඩයන්ට බෙදා දැක්විය හැකි ය. උදාහරණ වශයෙන්;

i. ප්‍රමාණය අනුව - ක්ෂුද්‍ර, කුඩා, මධ්‍ය පරිමාණ ව්‍යාපාර

ii. ව්‍යාපාරයේ ස්වභාවය අනුව- කෘෂිකාර්මික, කාර්මික, සේවා

iii. පිහිටා ඇති ප්‍රදේශ අනුව - ග්‍රාමීය, නාගරික

iv. හිමිකාරිත්වය අනුව - තනි පුද්ගල, හවුල්කාරිත්ව, පෞද්ගලික, පොදු සීමිත සමාගම් හා අනෙකුත් ව්‍යාපාර

### 4.1 ව්‍යාපාරයේ ප්‍රමාණය අනුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හඳුනා ගැනීම

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඒවායේ ප්‍රමාණය මත ප්‍රධාන වශයෙන් කොටස් 3කට බෙදා වෙන් කර දක්වයි. එනම් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ලෙසයි. මෙසේ වෙන් කර දැක්වීමට පාදක වන කරුණු කිහිපයක් පහත දැක්වේ.

- සේවක සංඛ්‍යාව/මානව සම්පත් ප්‍රමාණය
- වාර්ෂික පිරිවැටුම
- ප්‍රාග්ධනයේ ප්‍රමාණය
- නිෂ්පාදන ඒකක ප්‍රමාණය

විවිධ රටවල් විවිධාකාරයෙන් තම රටවලට ආවේණික වූ නිර්වචන සකස් කර ගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් මෙම කරුණු පදනම් කරගෙනයි. ඒ අනුව, ශ්‍රී ලංකාවේ ද, 2015 වර්ෂයේ වාර්ෂික පිරිවැටුම හා සේවක සංඛ්‍යාව පදනම් කර ගෙන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා නිර්වචනයක් සකස් කෙරුණි. මෙසේ සැකසුණු නිර්වචනයන් පිළිබඳ ඉහතින් විස්තර කර ඇත.

### 4.2 ව්‍යාපාරයේ ස්වභාවය අනුව

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර එහි ස්වභාවය අනුව ප්‍රධාන කොටස් 3කට පුළුල් ව බෙදා දැක්විය හැකියි.

**i. කෘෂිකාර්මික අංශය**

ලෝකයේ බොහෝ රටවල් කෘෂිකාර්මික අංශයට ලබා දෙන දායකත්වය ඉතා විශාල වේ. රටක පරිභෝජනයට මෙන් ම අපනයනය අරමුණු කර ගෙන ද කෘෂි අංශයේ

නිෂ්පාදන කටයුතු සිදු වේ. කෘෂි ක්ෂේත්‍රය; වගාවන්, ගොවිපොළ කටයුතු සැකසීම් හා අනෙකුත් නිෂ්පාදන යන අංශ රාශියක් යටතේ ක්‍රියාත්මක වෙයි. විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල කෘෂි අංශයට අදාළ ව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර කටයුතු බහුල ව සිදු වෙයි.

ශ්‍රී ලංකාවේ කෘෂි කර්මාන්තය, වී වගාව, තේ, රබර්, පොල්, පළතුරු සහ එළවළු, සුළු බෝග වගාව, කිරි හා කිරි ආශ්‍රිත කර්මාන්ත මෙන් ම සත්ව ආහාර නිෂ්පාදන ද කෘෂි අංශය යටතේ දැකිය හැකි ය. ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන බෝග තුනෙහි දළ ජාතික නිෂ්පාදිතයට ඇති දායකත්වය පහත වගුවෙන් පෙන්නුම් කෙරේ.

**වගුව 7 : ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන බෝග තුනෙන් දළ ජාතික නිෂ්පාදිතයට ඇති දායකත්වය**

| බෝගය | වර්ෂය | | | | |
|---|---|---|---|---|---|
| | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
| තේ (කිලෝ ග්‍රෑම් මිලියන) | 329 | 293 | 307 | 304 | 300 |
| රබර් (කිලෝ ග්‍රෑම් මිලියන) | 87 | 79 | 83 | 83 | 75 |
| පොල් (ගෙඩි මිලියන) | 3,056 | 3,011 | 2,450 | 2,623 | 3,086 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව

දළ ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත් කළ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය විශාල පසුබෑමකට යොමු වී තිබේ. ඒ බව පහත වගුවෙන් අවබෝධ කර ගත හැකි වේ.

**වගුව 8 : දළ ජාතික නිෂ්පාදිතයට කෘෂි අංශයේ දායකත්වය**

| වර්ෂය | 1954 | 1970 | 1980 | 1990 | 2000 | 2010 | 2018 | 2019 |
|---|---|---|---|---|---|---|---|---|
| කෘෂි අංශය (%) | 46.5 | 28.3 | 27.6 | 26.3 | 19.9 | 8.5 | 7.9 | 7.4 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

### ii. කාර්මික අංශය

ලෝකයේ බොහෝ රටවල් කාර්මිකරණයට නතු වී ඇති අතර කෘෂි කර්මාන්තය හා සසඳා බලන කළ විශාල දායකත්වයක් දරනු ලබන්නේ කාර්මික අංශයයි. එහි දී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ව්‍යාප්තිය ද කෘෂි අංශයට සාපේක්ෂ ව ඉහළ අගයක් ගනී. ශ්‍රී ලංකාවේ කාර්මික අංශයෙන් ද ආර්ථිකයට වැදගත් දායකත්වයක් ලබා දෙන අතර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර බොහෝමයක් ස්ථාපනය වී තිබෙන්නේ ඇඟළුම් ආශ්‍රිත නිෂ්පාදන, ඉදිකිරීම්, ආහාර හා ආහාර ආශ්‍රිත නිෂ්පාදන ව්‍යාපාර, දැව ආශ්‍රිත නිෂ්පාදන හා අනෙකුත් කාර්මික නිෂ්පාදන පාදක කර ගෙනයි. පසුගිය වසර දෙක තුළ කාර්මික අංශයට දේශීය බැංකු පද්ධතිය හරහා ණය ගලා ගොස් ඇති ආකාරය පහත වගුවෙන් පෙන්නුම් කරයි.

**වගුව 9: කාර්මික අංශයට දේශීය බැංකු පද්ධතිය හරහා ණය ගලා යාම්**

| කර්මාන්තය | 2018 (රු. මිලියන) | 2019 (රු. මිලියන) |
|---|---|---|
| ඉදිකිරීම් | 1,133,752 | 1,197,629 |
| ආහාර හා ආහාර ආශ්‍රිත නිෂ්පාදන | 124,644 | 130,800 |
| ඇඟළුම් | 201,556 | 214,632 |
| දැව ආශ්‍රිත නිෂ්පාදන | 19,988 | 21,462 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව

වගුව 10: දළ ජාතික නිෂ්පාදිතයට කාර්මික අංශයේ දායකත්වය

| වර්ෂය | දායකත්වය (%) |
|---|---|
| 2015 | 27.8 |
| 2016 | 27.8 |
| 2017 | 26.8 |
| 2018 | 26.6 |
| 2019 | 27.4 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව

iii. සේවා අංශය

විශාල පරාසයක පැතිරුණු සේවා අංශය විවිධ කාර්යයන් අරමුණු කර ගෙන ක්‍රියාත්මක වෙයි. ඒ අතරට සෞඛ්‍ය සේවාව මගී ප්‍රවාහනය, භාණ්ඩ ප්‍රවාහනය, බැංකු හා රක්ෂණ කටයුතු, සංචාරක කර්මාන්තය, අධ්‍යාපනය, විදුලි සංදේශ කටයුතු, ඉදිකිරීම්, රූපලාවන්‍ය ආදිය රටක කැපී පෙනෙන සේවා දායකත්වය ලබා දෙන අංශ වේ.

වගුව 11: දළ ජාතික නිෂ්පාදිතයට සේවා අංශයේ දායකත්වය

| වර්ෂය | දායකත්වය (%) |
|---|---|
| 2015 | 57.4 |
| 2016 | 56.4 |
| 2017 | 56.1 |
| 2018 | 57.1 |
| 2019 | 58.2 |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව

5. ගෝලීයකරණය, ආර්ථික ලිහිල්කරණය හා නව තාක්ෂණික බිහිවීම් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වලට බලපාන ආකාරය

**ගෝලීයකරණය** : පුළුල් ක්‍රියාදාමයකි. ආවෘත ආර්ථිකයක සිට විවෘත ආර්ථිකයකට ගමන් කිරීමේ දී ගෝලීයකරණය වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. තමන් විසින් නිපදවන ලද දේවල් අනෙක් අය අතරට බෙදා හරින ලද අතීත ක්‍රියාදාමය කෙමෙන් කෙමෙන් පුද්ගල දියුණුවත් සමග හුවමාරු ආර්ථිකයෙන් මිදී වාණිජමය වශයෙන් නිෂ්පාදනය කිරීමට ආරම්භ වූ යුගයේ සිට රටක් තුළ අතිරික්ත භාණ්ඩ හා සේවා තවත් රටක් හෝ රටවල් කිහිපයක් අතර වෙළෙඳාම් කිරීම ආරම්භ වීමත්, තාක්ෂණයේ දියුණුවත් යන දෙකෙහි ම ප්‍රතිඵලයක් වශයෙන් ගෝලීයකරණය ආරම්භ විය.

ඒ අනුව, ගෝලීයකරණය යනු විවිධ ජාතීන්, රටවල් හෝ රාජ්‍යයන් අතර මෙන් ම ව්‍යාපාර හා පුද්ගලයන් අතර ඇති වන සම්බන්ධතාව හා අන්‍යෝන්‍ය ගනුදෙනු බෙදා ගැනීම් වලින් යුත් පුළුල් ක්‍රියාදාමයකි. මෙම ක්‍රියාදාමයට අන්තර්ජාතික වෙළෙඳාම හා ආයෝජනයන් ඇතුළත් වන අතර තොරතුරු තාක්ෂණය මුල්කර ගනිමින් රටවල්, පුද්ගලයින් හා සංවිධාන අතර මෙම ගනුදෙනු කටයුතු සිදු වේ.

**ආර්ථික ලිහිල්කරණය** : විවිධ රටවල් විවිධ ආර්ථිකයන් අතර හුවමාරු සිදු කර ගැනීමේ දී විවිධ රෙගුලාසි හා සම්බන්ධතා පැනවීම ඕනෑ ම රටකට සාමාන්‍ය වූ පොදු කරුණකි. නමුත්, ගෝලීයකරණයත් සමග ආර්ථිකයන්ගේ ලිහිල්කරණයන් ආරම්භ වන්නේ රටවල් අතර සහයෝගීතාව වර්ධනය කිරීමට ගන්නා ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් වශයෙනුයි. එමෙන් ම එකිනෙක රටවලට අවශ්‍ය භාණ්ඩ/සේවා නිෂ්පාදනය කොට වෙනත් රටවලින් ලබා ගැනීමත් විවිධ ආනයන කටයුතුවල දීත් මෙවැනි ලිහිල්කරණයන් දක්නට ලැබේ.

ඒ අනුව, ආර්ථික ලිහිල්කරණය ලෙස හඳුන්වන්නේ විශේෂයෙන් ම පෞද්ගලික අංශයේ ව්‍යාපාරවල සහභාගීත්වය ඉහළ මට්ටමකට රැගෙන ඒමේ අපේක්ෂාවෙන් අන්තර්ජාතික වෙළෙඳපොළට ප්‍රවේශ වීමට හැකි වන පරිදි විවිධ රාජ්‍යයන්ගේ පවතින නීති රෙගුලාසි හා සම්බාධක ලිහිල් කිරීමක් වේ. මෙහි දී, තම රටේ නිෂ්පාදනය කළ හැකි අංශ සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය මෙන් ම තවත් රටකට අවශ්‍ය භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමටත් ඒවා කිසිදු බාධාවකින් තොර ව වෙළෙඳපොළ කරා රැගෙන යෑමටත් ආර්ථික ලිහිල්කරණයෙන් අවස්ථාව සැලසෙයි.

**නව තාක්ෂණික බිහිවීම** : ගල් යුගයේ සිට රොබෝ තාක්ෂණ යුගය දක්වා ද, අභ්‍යවකාශ තරණයන් හා විවිධ පර්යේෂණ, සොයා ගැනීම් හා නිපදවීම් සිදුවන්නේ තාක්ෂණයේ සීඝ්‍ර දියුණුවත් සමඟයි. අතීතයේ රටවල් අතර විශාල වශයෙන් හුවමාරු වීම් හා ගනුදෙනු කටයුතු සිදු නො වූයේ තාක්ෂණය එතරම් දියුණු තත්ත්වයක නොපැවතුනු නිසා ය. ක්‍රමයෙන් හා සීඝ්‍රයෙන් දියුණු වන තාක්ෂණය හේතුවෙන් ලෝකයේ රටවල් අතර ව්‍යාපාර කටයුතු දියුණුවීමත් අපනයන හා ආනයන කටයුතු පුළුල් වීමත් සිදු විය.

### 5.1 ගෝලීයකරණය, ආර්ථික ලිහිල්කරණය හා තාක්ෂණයේ දියුණුවත් සමඟ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ක්ෂේත්‍රයේ ඇති වූ පෙරළිය.

#### i. ව්‍යාපාරවල භූමිකාව වෙනස් වීම

පාරම්පරික නිපැයුම්වලින් ඉවත් ව නව නිපැයුම් කරා එළඹීමටත් ඉහත කරුණු හේතුවෙන් ඇති වන භූගෝලීය වෙනස්කම් හා ආර්ථික ප්‍රතිපත්තිවල සංවර්ධනයන් හේතු කොට ගෙන වඩාත් ඒකාබද්ධ වූ ජාත්‍යන්තර වෙළෙඳපොළකට සරිලන පරිදි මිල හා ගුණාත්මකභාවයෙන් ස්වයංපෝෂිත වූ ව්‍යාපාරික නිෂ්පාදන බිහි කිරීමටත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ක්‍රමයෙන් පරිවර්තනය වෙමින් පවතී.

#### ii. රාජ්‍ය අංශයෙන් පෞද්ගලික අංශයට කර්මාන්ත විතැන් වීම

කාර්මික වර්ධනයත් සමඟ රාජ්‍යයන් විසින් ප්‍රධාන බලවේගයක් ලෙස වෙළෙඳපොළ හඳුනා ගන්නා ලදී. මූල්‍ය අංශයේ කාර්යක්ෂම වර්ධනයත් සමඟ පෞද්ගලික අංශය විසින් ආර්ථික වර්ධනයට අදාළ කාර්යභාරය ඉහළ යනු ඇතැයි අපේක්ෂා කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ආයෝජන අරමුදල් සඳහා අන්තර්ජාතික තරඟකාරීත්වය ඉතා විශාල ලෙස පවතින බව දක්නට ලැබුණි. ඒ තුළින් ලාභ ලබන්නන් මෙන් ම පාඩු ලබන්නන් ද ආර්ථිකයේ ජනිත වීමට පටන් ගත් අතර, බොහෝ රාජ්‍ය අංශයේ ව්‍යාපාර පෞද්ගලිකකරණයට අනුවර්තනය වීමත් ආර්ථිකයේ විවිධ අංශයන් ආවරණය කරමින් පෞද්ගලික මට්ටමේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත හා ව්‍යාපාර බිහිවීමටත් පටන් ගැනුණි.

#### iii. ආර්ථික වර්ධනයට පෞද්ගලික අංශයේ දායකත්වය ඉහළ යෑම

ආර්ථික ලිහිල්කරණය හා ගෝලීයකරණයේ ප්‍රතිඵලයක් වශයෙන් බොහෝ ව්‍යාපාර පෞද්ගලික අංශයට අනුයුක්ත ව ආරම්භ විය. බොහෝ දෙනෙක් අපේක්ෂා කළ ආකාරයට ගෝලීය ආර්ථික වෙනස්වීම්වලට අනුගත වන ආකාරයෙන් හැඩ ගැන්වීමට පෞද්ගලික අංශයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වලට හැකියාව ලැබුණි (2015 ලෝක බැංකු වාර්තාවලට අනුව). ඒ තුළින් ආර්ථිකයට අවශ්‍ය නිෂ්පාදන ධාරිතාව ඉහළ නංවා ගැනීමටත්, රැකියා ව්‍යුක්තියට පිළියමක් වශයෙනුත් පෞද්ගලික අංශයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල බිහිවීම වැදගත් කොට සැලකිය හැකි ය.

## 6. ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ක්ෂේත්‍රය

ශ්‍රී ලංකා ආර්ථිකයේ විශාල ප්‍රමාණයක් ආවරණය වන්නේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ක්ෂේත්‍රය මූලික කර ගනිමින් ය. එය මුළු ව්‍යාපාරික ක්ෂේත්‍රය හා සසඳන කළ 80%ක පමණ ප්‍රමාණයක් ආවරණය කරනු ලබයි (http://www.nhrep.gov.lk). ආර්ථිකයේ ප්‍රාථමික, ද්විතීයික හා තෘතීයික යන කුමන අංශයක් දෙස බැලුව ද සුළු හා මධ්‍ය පරිමාණ ක්ෂේත්‍රයේ විහිදීම ඉතා පුළුල් ව දක්නට ලැබෙන අතර රැකියා උත්පාදනය අතින් ද විශාල දායකත්වයක් ලැබෙනුයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ක්ෂේත්‍රය තුළිනි. එහි දී විවිධ කුසලතා ඇති, දක්ෂ එමෙන් ම අර්ධ පුහුණු හා නුපුහුණු ශ්‍රමිකයන් බොහෝ පිරිසක් ආවරණය කරමින් රැකියා වෙළෙඳපොළ ප්‍රවේශයට අවස්ථාව ලබා දීම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ක්ෂේත්‍රයේ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයකි.

වගුව 12: සුළු හා මධ්‍ය පරිමාණ ක්ෂේත්‍රයට අදාළ මූලික දත්ත (2018)

| අංශය | ප්‍රතිශතය (%) |
|---|---|
| දළ ජාතික නිෂ්පාදිතය | 52% |
| රැකියා නියුක්තිය | 35% |
| කාන්තා හිමිකාරිත්වය | 22% - 39% |
| කර්මාන්ත | 75% |

මූලාශ්‍රය: ජාතික මානව සම්පත් හා රැකියා ප්‍රතිපත්ති අමාත්‍යාංශය,
ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව http://www.ips.lk

ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර 500,000කට වඩා වැඩි ප්‍රමාණයක් පවතින අතර (https://www.cma_srilanka.org) එක් ව්‍යාපාරයක සාමාන්‍යයෙන් වැඩ කරන සේවක සංඛ්‍යාව 3-5 ත් අතර ප්‍රමාණයක් වේ.

වගුව 13: ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ක්ෂේත්‍රය විහිදී ඇති ආකාරය

| ව්‍යාපාර අංශය | ක්ෂුද්‍ර | සුළු හා මධ්‍ය පරිමාණ | මහා පරිමාණ |
|---|---|---|---|
| ව්‍යාපාර සංඛ්‍යාව | 880,066 | 132,483 | 4,931 |
| සේවා නියුක්තිය | 1,160,138 | 930,889 | 915,883 |

මූලාශ්‍රය : www.cma_srilanka.org, vol 06 No.3 - December 2018

රැකියා අවස්ථා නිර්මාණය වීමේ දී අත්‍යවශ්‍ය මූලාශ්‍රයක් ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හඳුනා ගෙන ඇති අතර රැකියා නියුක්තියෙන් 35%ක පමණ ප්‍රතිශතයක් ශ්‍රී ලංකාවේ ආවරණය කරනු ලබන්නේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර තුළින් ය (ජාතික මානව සම්පත් හා රැකියා ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ වෙබ් අඩවිය).

ඒ අනුව, ශ්‍රී ලංකාවේ සංවර්ධන කාර්යයේ ප්‍රවර්ධනාත්මක අංශය ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරනු ලබයි. වර්තමානයේ බොහෝමයක් ප්‍රතිපත්තිමය සාකච්ඡා මූලික වී ඇත්තේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර මුල් කර ගෙන වීම වැදගත් අංගයක් වන අතර එහි දී ව්‍යාවසායකත්ව හැකියාවන් වර්ධනය කිරීම, නව සොයා ගැනීම් ඇති කිරීම හා ඒ තුළින් ආර්ථික වර්ධනය වේගවත් කිරීම අපේක්ෂා කරයි. එමෙන් ම සමාජ සහජීවනය ප්‍රවර්ධනය කිරීම සඳහා ද සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර වැදගත් දායකත්වයක් ලබා දෙයි.

කෘෂිකාර්මික, කාර්මික හා සේවා අංශවල ව්‍යාප්ත වූ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ග්‍රාමීය හා නාගරික දෙඅංශයේ ම ඉතා පුළුල් ලෙස ක්‍රියාත්මක වන අතර රටේ ආර්ථික සංවර්ධනයේ පුරෝගාමී ක්ෂේත්‍රයක් ද වෙයි.

වගුව 14 : දළ දේශීය නිෂ්පාදිතය සඳහා ඇති ආංශික දායකත්වය

| අංශය | දායකත්වය (%) |
|---|---|
| කෘෂි කාර්මික | 7.0 |
| කාර්මික | 26.1 |
| සේවා | 57.7 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව, සමාජ ආර්ථික දත්ත 2019


### 6.1 ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ක්ෂේත්‍රයට ආවේණික වූ ලක්ෂණ

i. ශ්‍රම වෙළෙඳපොළ


රැකියා නියුක්තිය අතින් බලන කළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල වැඩි වශයෙන් නිරත වන්නේ පුරුෂ

පාර්ශ්වයයි. කාන්තා සහභාගීත්වය ද සැලකිය යුතු මට්ටමකින් දක්නට ලැබෙන අතර ඔවුන්ගේ සහභාගීත්වය තවදුරටත් ඉහළ නංවා ගැනීමට අවශ්‍ය වැඩ පිළිවෙලවල් දියත් කළ යුතු යි. රැකියා වියුක්තිය ඉහළ යන කාල වකවානුවල විශාල වශයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ව්‍යාප්ත කරන්නේ නම් රජයට මුහුණ දීමට සිදු වන ගැටළු රාශියකට පිළියම් ලැබෙනු ඇත. ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළෙඳපොළට අදාළ දත්ත කිහිපයක් පහත රූප සටහන්වලින් දක්වා ඇත.

1 රූප සටහන: ශ්‍රම වෙළෙඳපොළ




2 රූප සටහන: රැකියා වියුක්ති අනුපාතය




මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

### ii. දැනුම හා කුසලතාව


ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල නියැලෙන බොහෝ ව්‍යාවසායකයින් හට ඉතා ඉහළ තාක්ෂණික දැනුමක් හා අවබෝධයක් නොමැත. නමුත් තම ව්‍යාපාරය නිසි ලෙස හසුරුවා ගෙන ලාභ ඉපයීමේ තත්ත්වයට පත්කර ගැනීමට ඔවුන්ට හැකියාව තිබේ. නමුත් නිෂ්පාදන පිරිවැය ඉහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස ව්‍යාවසායකයින් මෙම ක්ෂේත්‍රයේ නිරත වන සේවකයින් සඳහා පුහුණු වීම්, සෞඛ්‍ය සේවා හා සුභසාධන පහසුකම් ලබා දීමට වැඩි කැමැත්තක් නො දක්වයි. ඒ නිසා මෙම ව්‍යාපාර වල නියැලෙන ව්‍යාවසායකයින් සඳහා පුද්ගල/මානව සම්පත් කළමනාකරණ කටයුතු පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් හා අත්දැකීමක් ලබා දීම වැදගත් වෙයි.

වගුව 15 : ශ්‍රී ලංකාවේ තෝරා ගන්නා ලද ආර්ථික දත්ත

| | | |
|---|---|---|
| සාක්ෂරතා මට්ටම (%) | | 92.5% |
| ශ්‍රම බලකා සහභාගීත්වය | | 52.3% |
| ක්ෂුද්‍ර ව්‍යාපාර | | 45.0% |
| කුඩා ව්‍යාපාර | | 10.0% |
| මධ්‍ය හා මහා පරිමාණ ව්‍යාපාර | | 45.0% |
| ලියාපදිංචි ව්‍යාපාර | | 42.0% |
| කාන්තා ව්‍යාවසායකත්වය | | |
| - ග්‍රාමීය | 35% | 25.0% |
| - නාගරික | 28% | |

මූලාශ්‍රය : ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

3 රූප සටහන: ව්‍යාපාර විහිදීම




මූලාශ්‍රය: ජාත්‍යන්තර ශ්‍රමබලකා සංවිධානය (2019)

iii. රැකියාවට ඇති කැමැත්ත

සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රයට ආවේණික වූ ප්‍රධාන ලක්ෂණයක් වන්නේ මෙම ව්‍යාපාර වල සේවයේ නියුතු සේවකයින්ගේ පැමිණීම අඛණ්ඩභාවයකින් දැකිය නො හැකි වීමයි. එම නිසා අපේක්ෂිත නිෂ්පාදන ප්‍රමාණය අහිමි වීම හා සේවක තෘප්තිමත් බව අඩු වීම පොදු ලක්ෂණ ලෙස දැකිය හැකි ය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ආර්ථිකය අපේක්ෂා කරන දායකත්වය නො ලැබී යන අතර ම කාර්ය සාධනයද අඩු මට්ටමක පවතී.

වගුව 16: රැකියා වියුක්තිය පිළිබඳ දත්ත

| වයස් කාණ්ඩය | රැකියා වියුක්ති අනුපාතය (%) | | |
|---|---|---|---|
| | | පිරිමි | කාන්තා |
| මුළු | 4.8 | 3.4 | 6.9 |
| 15-24 | 21.6 | 18.9 | 26.6 |
| 25-29 | 9.0 | 4.4 | 16.3 |
| 30ට වැඩි | 1.7 | 1.1 | 2.8 |

මූලාශ්‍රය: ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

ඉහත වගුව අනුව වයස් කාණ්ඩ 15-24 ත් අතර විශාල ප්‍රමාණයක් රැකියා වියුක්තියෙන් පෙළෙන අතර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දියුණු කිරීමේ දී මෙම අංශයේ දායකත්වය වඩාත් වැදගත් වේ.

## 7. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීමෙන් ආර්ථිකයට අත් කර ගත හැකි වාසි

### i. රැකියා අවස්ථා නිර්මාණය කිරීම

යම් පුද්ගලයෙකු තම හැකියාවන් හා අධ්‍යාපන දැනුම, ඥානය පදනම් කර ගෙන හෝ පරම්පරාවෙන් උරුම වීම මත හෝ නව ක්ෂේත්‍රයන් අත්හදා බැලීමේ අපේක්ෂාවන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආරම්භ වීමත් ඒ තුලින් ව්‍යාවසායකයින් නිර්මාණය වීමත් සිදු වේ. ඊනෑ ම පුද්ගලයෙකු ව්‍යාපාරයක් ආරම්භ කර පවත්වා ගෙන

යනු ලබන්නේ ලාභ අපේක්ෂාවෙනි. විශේෂයෙන් ම තනි පුද්ගලයෙකු හෝ කිහිප දෙනෙකු එකතු වී සුළුවෙන් හෝ ආරම්භ කරන ව්‍යාපාරයක් තවත් පුද්ගලයන් කිහිප දෙනෙකුට හෝ විශාල පිරිසකට රැකියා වෙළෙඳපොළක් නිර්මාණය කර දෙනු ලබන්නේ රටක ආර්ථිකයකට පවත්නා ගැටලුවලට විසඳුම් ද ලබා දෙමින් ය. විශේෂයෙන් ම රැකියා අවස්ථා නිර්මාණය වීමටත්, අලුතින් ව්‍යාවසායකයින් බිහි කිරීමටත්, රැකියා වියුක්තියට පිළියමක් ලෙසත්, ඵලදායී නිෂ්පාදන ඇති කිරීමටත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර විශාල දායකත්වයක් ලබා දෙයි.

තම පෞද්ගලික ඉතිරිකිරීම් මෙන් ම මූල්‍ය අංශයේ ඉතිරිකිරීම් ද භාවිතයට ගනිමින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන්හි ආයෝජනයට ජනතාව පෙළඹවීමට සෑම රටක් ම උත්සාහ දරයි. ශ්‍රී ලංකාව වැනි දියුණු වෙමින් පවතින රටක් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ක්ෂේත්‍රය දිරි ගැන්වීමට විටින් විට විවිධ ක්‍රියාමාර්ග දියත් කොට ඇත. රජයේ අයවැය ප්‍රකාශයේ දී මෙම අංශය කෙරෙහි වැඩි නැඹුරුවක් දක්වන අතර මූල්‍ය අංශයේ ණය ගලා යෑම් ඉහළ නංවා ඇත.

උදාහරණයක් ලෙස 2017 වසරේ අයවැය යෝජනා තුළින් කාන්තා හා තරුණ ජන කොටස්වල ව්‍යාපාර

**වගුව 17 : ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය**

| වයස් කාණ්ඩය | මුළු ජනගහනයෙන් (%) | පිරිමි (%) | ගැහැණු (%) |
|---|---|---|---|
| මුළු | 52.6 | 73.4 | 34.9 |
| 15-19 | 13.6 | 18.8 | 8.3 |
| 20-24 | 54.2 | 72.9 | 37.7 |
| 25-29 | 67.6 | 91.9 | 47.4 |
| 30-34 | 66.4 | 95.0 | 43.2 |
| 35-39 | 68.9 | 97.8 | 46.6 |
| 40-44 | 70.3 | 95.4 | 49.3 |
| 45-49 | 70.2 | 94.2 | 48.8 |
| 50-54 | 68.8 | 93.3 | 48.1 |
| 55-59 | 58.6 | 83.9 | 36.5 |
| 60+ | 31.4 | 49.7 | 16.9 |

මූලාශ්‍රය: ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2019 පළවන කාර්තුව

ශ්‍රී ලංකාවේ කාන්තා ජනගහනයෙන් 74%කට වඩා වැඩි ප්‍රතිශතයක් ග්‍රාමීය මෙන් ම නාගරික ප්‍රදේශවල ක්‍රියාකාරී ශ්‍රම බලකායට තවමත් එකතු වී නොමැත (ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව). ඒ නිසා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර තවදුරටත් ව්‍යාප්ත කිරීම තුළින් ආදායම් උත්පාදන කාර්යයක නියැලී නො සිටින කාන්තා ජන කොටස් මෙන් ම ආර්ථික ක්‍රියාකාරකම්වලට සක්‍රීය ව දායකත්වයක් නො දෙන සියලු ජන කොටස් ආවරණය කිරීමට හැකියාව ලැබෙනු ඇත.

### ii. දේශීය ඉතුරුම් භාවිතයට ගැනීම

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයේ වැදගත් අංගයක් වන්නේ ඉතිරිකිරීම් භාවිතයට ගැනීමයි.

දිරි ගැන්වීම සඳහා සෑම ලියාපදිංචි බැංකුවක් ම තම ණය කළඹින් 5%ක ප්‍රතිශතයක් මෙම අංශයට වෙන් කළ යුතු බවට තීරණය විය.

### iii. දිළිඳුබව තුරන් කිරීම

ග්‍රාමීය හෝ නාගරික අංශයේ ජීවත් වන ඕනෑ ම අයකුට සුළු හෝ මධ්‍ය පරිමාණ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට කිසිදු බාධාවක් නොමැත. මුදල් ඇති හෝ නැති බව විශාල ප්‍රශ්නයක් කර නො ගත යුතු අතර සුළුවෙන් හෝ ව්‍යාපාරයක් ආරම්භ කර වැඩිදියුණු කර ගැනීමේ හැකියාවක් ලෝකයේ බොහෝ රටවල ජීවත් වන ජන කොටස්වලට පවතී.

විශේෂයෙන් ම ශ්‍රී ලංකාවේ බොහොමයක් ග්‍රාමීය ප්‍රදේශ ඉලක්ක කර ගනිමින් විවිධ සංවර්ධන වැඩසටහන්

ක්‍රියාත්මක වන්නේ මෙරට පවතින දිළිඳු බවේ විෂම චක්‍රයට පිළියමක් ලෙසයි.

වගුව 18: ශ්‍රී ලංකාවේ දිළිඳු බව පිළිබඳ සංඛ්‍යා සටහන

| විස්තරය | ප්‍රතිශතය (%) |
|---|---|
| ජාතික මට්ටමේ දරිද්‍රතා රේඛාවට පහළින් සිටින ජනගහනය | 4.1 |
| දිනකට මිලදී ගැනීමේ හැකියාව ඩොලර් 1.90ට වඩා අඩු ජන කොටස | 0.3 |
| රැකියා වියුක්තිය | 4.2 |

මූලාශ්‍රය: ආසියානු සංවර්ධන බැංකුවේ දත්ත අනුව (2019)

ජන කොටස් අතර පවතින දරිද්‍රතාවේ පරතරය හෙවත් විෂමතාව අඩු කිරීමට නම් ආර්ථිකයේ කෘෂිකාර්මික, කාර්මික හා සේවා යන අංශ තුනට ම ප්‍රමුඛත්වය ලබා දී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ව්‍යාප්ත කළ යුතුයි. ඒ තුළින් පුද්ගලයින්ගේ ආදායම් ඉපයීමේ හැකියාව වර්ධනය වීමෙන් හා ඉතිරිකිරීමේ පුරුද්ද වර්ධනය කිරීම තුළින් දිළිඳුබව තුරන් කිරීමට හැකියාව ලැබෙනු ඇත.

### iv. ආදායම් බෙදී යාම

රටක පවතින ආදායම් බෙදී යෑමේ පරතරයට විසඳුමක් ලෙස ද සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ව්‍යාප්තිය වැදගත් වේ. විශේෂයෙන්ම යම් ආදායම් මට්ටමක් පවතින ජන කොටස් හෝ ව්‍යාවසායකයින් විසින් ආරම්භ කරන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර තුළින් තවත් ජන කොටසකට රැකියා අවස්ථා හිමිවීමෙන් ඔවුන්ගේ දෛනික ඉපයීම් මට්ටම ද ඉහළ යනු ඇත. ඒ තුළින් රජයකට දැරීමට සිදු වන පිරිවැය අවම වන අතර එම මුදල් ඵලදායී සංවර්ධන ක්‍රියාවලියකට යොමු කිරීමට හැකියාව ලැබෙනු ඇත.

### v. ප්‍රාදේශීය සංවර්ධනය

මෙය ඉතා පුළුල් ක්‍රමවේදයක් වන අතර ග්‍රාමීය මට්ටමින් බිහි වන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර තුළින් සමස්තයක් වශයෙන් යම් ප්‍රදේශයක කෘෂි, නිෂ්පාදන හා සේවා යන අංශ තුන ම ආවරණය කළ හැකි නම් එම ප්‍රදේශයේ සංවර්ධනය නිතැතින් ම ඇති වේ. පුද්ගල හැකියාවන් භාවිත කිරීමත්, ආදායම් උත්පාදන මාර්ග ඇති කිරීමත්, පවතින සම්පත් උපරිම වශයෙන් භාවිත කිරීමත් තුළින් ප්‍රාදේශීය දියුණුව ඉහළ නැංවිය හැකි අතර එහි අවසාන ප්‍රතිඵලය වන්නේ රට සංවර්ධනය කරා ගමන් කරයි.

### vi. පුහුණුව, හැකියාවන් වර්ධනය හා ව්‍යාවසායකයින් බිහිවීම

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර බිහිවීම හා පවත්වා ගෙන යෑම තුළින් නිතැතින් ම රැකියා වෙළෙඳපොළක් නිර්මාණය වීමට අවකාශය ලැබේ. නමුත් මෙසේ ශ්‍රම වෙළෙඳපොළට පිවිසෙන බොහෝමයක් පුද්ගලයන් නිසි පුහුණුවක් නො ලද අය වන අතර ව්‍යාපාරික ක්ෂේත්‍රයේ අඛණ්ඩ ව නියැලීමෙන් තම හැකියාවන් හා කුසලතාවන් වර්ධනය කර ගැනීමට සිදු වනු ඇත. සමහර පුද්ගලයන් ශ්‍රම වෙළෙඳපොළට පිවිසෙන්නේ කිසිදු දැනුමක් නොමැති ව විය හැකි අතර තමා ලබා ගන්නා දැනුම හා අත්දැකීම් භාවිත කරමින් නව ව්‍යාපාර බිහිකරන්නේ ව්‍යාවසායකත්ව අත්දැකීම් ද ඉස්මතු කරමිනි. මනා ව්‍යාවසායකත්ව ගුණාංගවලින් පිරිපුන් ව්‍යාපාර දිගුකාලීන ව පැවතෙන අතර අනෙකුත් ව්‍යාපාර වෙළෙඳපොළෙන් ඉවත් වේ.

### vii. ආර්ථික නිෂ්පාදනයට දායක වීම හා අපනයන වෙළෙඳපොළට පිවිසීම

ඕනෑ ම රටක සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල නිෂ්පාදනය සමස්තයක් වශයෙන් යෙදවෙන්නේ එම රටේ පරිභෝජනය සඳහා ය. අතිරික්තයක් ඇතොත් ඒවා අන්තර්ජාතික වෙළෙඳපොළට සරිලන පරිදි සකසා අපනයනය කරනු ලබයි. ශ්‍රී ලංකාවේ කෘෂි අංශයට අදාළ ව තේ, රබර්, පොල් හා සුළු අපනයන බෝග අපනයන වෙළෙඳපොළ අරමුණු කර ගෙන නිෂ්පාදන කටයුතු සිදුවේ. ඒ නිසා අපනයන වෙළෙඳපොළ අරමුණු කර ගත් කෘෂි නිෂ්පාදන හා කාර්මික මෙන්

ම සේවා අංශයට සම්බන්ධ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීමෙන් රටේ සංවර්ධනයට ඉහළ දායකත්වයක් ලබා ගත හැකි වේ.

## 8. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධනය සඳහා පවතින බාධාවන්

ලෝකයේ බොහොමයක් රටවල් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ව්‍යාප්ත කිරීමට ප්‍රබල උත්සාහයක යෙදෙන නමුත් විවිධ බාධාවන් මතුවන්නේ මෙම ව්‍යාපාර ආරම්භ කිරීමේ දී හා පවත්වා ගෙන යෑමේ දී ය. එසේ පැන නගින බාධාවන්/ගැටලු කිහිපයක් පහත දැක්වේ.

### i. විධිමත් මූල්‍ය වෙළෙඳපොළට අවශ්‍ය පරිදි ප්‍රවේශ වීමට ඇති නො හැකියාව

මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වන්නේ බැංකු හා අනෙකුත් මූල්‍ය ආයතන වෙත පහසුවෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල හිමිකරුවන්ට ප්‍රවේශ වීමට ඇති නො හැකියාවයි. එයට ප්‍රධාන හේතුවක් වන්නේ මෙම අංශය අධික අවදානම් සහිත අංශයක් ලෙස සලකන බැවිනි. ප්‍රමාණවත් පරිදි ඇප සුරැකුම් නොමැති වීමත් ක්‍රමවත් ව්‍යාපාරික සැළසුම් නොමැති වීමත් හේතුවෙන් විධිමත් මූල්‍ය අංශයෙන් අවශ්‍ය මූල්‍ය පහසුකම් නිසියාකාර ව ලබා ගැනීමට අපහසු වී ඇත. ඒ අනුව අඩු ආදායම්ලාභී ජන කොටස් මූලික කර ගනිමින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරික ක්ෂේත්‍රය ව්‍යාප්ත කිරීමේ යම් යම් බාධාවන් පවතී.

### ii. කළමනාකාරිත්ව ගැටලු

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල සාර්ථකත්වයට පවතින තවත් බාධකයක් වන්නේ මෙම අංශයේ නියැලෙන පාර්ශ්වයන්ට නිසි කළමනාකාරිත්ව දැනුමක් හා හැකියාවන් නොමැති වීමයි. ඒ සඳහා ව්‍යාවසායකත්ව හා කළමනාකරණ කුසලතාවන්ගේ අඩුපාඩුකම් බොහෝ විට හේතු වෙයි. එමෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ක්ෂේත්‍රය නුපුහුණු හා අර්ධ පුහුණු ශ්‍රම බලකායකගෙන් ක්‍රියාත්මක වන නිසා කළමනාකාරිත්වයේ අඩු පාඩු පවතින්නේ නම් ව්‍යාපාරය සාර්ථක ව ඉදිරියට ගෙන යා නො හැක.

### iii. දැනුම වර්ධනය, පුහුණුව හා අධ්‍යාපනයේ පවතින අඩුපාඩු

නවීකරණය හා නව තාක්ෂණය සමඟ මුසු වන ලෝකයක සුළු හා මධ්‍ය පරිමාණ අංශයේ නියුතු පුද්ගල කණ්ඩායම් (ශ්‍රම බලකායට) නිසි පුහුණුවක් හා කුසලතා වර්ධනයක් සිදු කළ යුතුයි. නමුත් බොහෝ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ක්‍රියාත්මක වන්නේ අඩු පුහුණුවකින් හා ඉතා සුළුවෙන් දැනුම වර්ධනය කළ ශ්‍රමිකයන් යොදා ගනිමින් වීම මෙම ක්ෂේත්‍රයේ දැකිය හැකි සුලභ කරුණකි. ඒ නිසා අපේක්ෂිත නිෂ්පාදන හා ඵලදායී මට්ටම් කරා ගමන් කිරීමට අපහසු වනු ඇත.

### iv. යටිතල පහසුකම්වල පවතින අඩු පාඩු

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයේ කාර්ය සාධනය සඳහා සෘජු බලපෑමක් ඇති කරනු ලබන්නේ ඒ සඳහා හේතු වන යටිතල පහසුකම්වල ප්‍රමාණාත්මකභාවය මතයි. යටිතල පහසුකම් ලෙස සලකනු ලබන්නේ, මං මාවත්, විදුලි සංදේශ කටයුතු, විදුලිය හා ජල සැපයුමයි. මෙවැනි සේවාවන්ගේ අඛණ්ඩ සැපයුම හා ළඟා විය හැකි මිල ගණන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධනයේ දී සෘජු වශයෙන් බලපානු ලබයි.

### v. රාජ්‍ය ප්‍රතිපත්ති හා ඒවා ක්‍රියාවට නැංවීමේ දී පවතින අඩු පාඩු

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධනයට කොතෙකුත් යෝජනා, ප්‍රතිපත්ති රජයක් විසින් සකස් කරනු ලැබුව ද ඒවා නිසියාකාර ව ක්‍රියාත්මක නො වන්නේ නම් අපේක්ෂිත සංවර්ධන මට්ටම් කරා ළඟා විය නො හැක. අප අත්දැකීමෙන් දන්නා පරිදි විවිධ ජාතික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා විටින් විට යෝජනා ඉදිරිපත් කළ ද එවැනි යෝජනා යථාර්ථයක් බවට පත්වන්නේ ඉතා ම අඩු මට්ටමකිනි. එයට හේතුව වන්නේ ඒවා ක්‍රියාත්මක කිරීමේ දී පවතින ගැටලු හා ක්‍රියාත්මක කළත් පසු විපරම් නො කිරීම නිසා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අඛණ්ඩ ව පවත්වා ගෙන යන්නේ ද ඒවා බිඳ වැටී ඇත් ද යන්න පිළිබඳ නිසියාකාර දැනුමක් හා අවබෝධයක් නොමැති වීමයි.

## 9. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දිරි ගැන්වීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග

### i. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධනය සඳහා ජාතික ප්‍රතිපත්ති රාමුවක් සැකසීම

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ මග පෙන්වීම යටතේ 2015 වසරේ සුළු හා මධ්‍ය

පරිමාණ ව්‍යාපාර හඳුනා ගැනීමට ජාතික මට්ටමේ නිර්ණායකයන් ඉදිරිපත් කිරීමත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර දියුණු කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති රාමුවක් සකස් කර ඉදිරිපත් කිරීමත් සිදු විය. මෙම ප්‍රතිපත්ති රාමුව පහත සඳහන් අරමුණුවලින් සමන්විත විය.

අ) ඉහළ හැකියාවන්ගෙන් යුත් ව්‍යාපාර ආයතන හා පුද්ගලයන් ද අඛණ්ඩ ව ඉදිරියට පවත්වා ගෙන යා හැකි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ද ප්‍රවර්ධනය කිරීම

ආ) ආංශික ප්‍රවේශය පදනම් කර ගෙන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධනය කිරීම

ඇ) ඉහළ අතිරේක වටිනාකම්වලින් යුත් ව්‍යාපාර ප්‍රවර්ධනය හා ඉහළ සාපේක්ෂ වාසි හිමි කර දෙන දේශීය අමුද්‍රව්‍ය භාවිතයට යොමු කිරීම

ඈ) අපනයනය අරමුණු කරගත් හෝ ආනයනවලට ආදේශකයක් වන ව්‍යාපාර සහ කර්මාන්ත ධෛර්යමත් කිරීම හා ප්‍රවර්ධනය

ඉ) රැකියා නිර්මාණය හෝ සේවා නියුක්තිය වැඩි වන පරිදි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීම

ඊ) නාගරික හා ග්‍රාමීය අසමතුලිතතාව අවම කිරීමට හැකි වන පරිදි ව්‍යාපාර ස්ථාන ගත කිරීම හා ප්‍රවර්ධනය

උ) පාරම්පරික ක්‍රමවේදවලින් බැහැර ව නවීන ක්‍රමවේද අනුගමනය කිරීමටත්, ඉහළ වටිනාකම් සහිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමටත්, නව නිපැයුම් බිහි කිරීමටත් හැකි වන ආකාරයට පරිසරය නිර්මාණය කිරීම

ඌ) ආර්ථික සංවර්ධනය ඉහළ නැංවීමේ අපේක්ෂාවෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ශක්තිමත් කිරීමත් ඒ තුළින් රැකියා නියුක්තිය ඉහළ නැංවීමත් ආදායම් උත්පාදන මාර්ග බිහිකිරීමත් අරමුණු කරගෙන පවතින අවස්ථාවන් විවෘත කරදීම

එ) සමස්ත ශ්‍රී ලංකාව ම ආවරණය කරමින් ප්‍රාදේශීය සංවර්ධන සමතුලිතතාවක් ලඟා කර ගැනීම

ඒ) පරිසරයට හිතකාමී අයුරින් සෑම මට්ටමක ම පවතින සම්පත් කාර්යක්ෂම ව යොදා ගැනීම ප්‍රවර්ධනය කිරීම

ii. කෘෂි කර්මාන්තයට අවශ්‍ය පොහොර සහනාධාර හා අනෙකුත් සහනාධාර ක්‍රම අඛණ්ඩ ව ක්‍රියාත්මක කිරීම

iii. වගාවන් හා නැවත වගාවන් සඳහා සහනාධාර ලබා දීම

iv. ව්‍යාවසායකත්ව සංවර්ධනය වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සැකසීම හා දිරිගැන්වීම් ක්‍රමෝපායන් සකස් කිරීම

v. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම සඳහා විවිධ බදු ලිහිල් කිරීම් හා ඉවත්කිරීම් සිදු කිරීම

vi. "Enterprise Sri Lanka" වැඩ සටහන ක්‍රියාත්මක කිරීම

vii. අඩු පොලී අනුපාත යටතේ මූල්‍ය පහසුකම් ලබා දීම හා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ක්ෂේත්‍රයට ගලා යන මූල්‍ය පහසුකම් වැඩි කිරීම

viii. විධිමත් මූල්‍ය අංශයේ අවධානය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධනය කෙරෙහි යොමු කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සැකසීම හා නියෝග නිකුත් කිරීම